ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
சமுத்திர பல்கலைக்கழகம்
The Ocean University of Sri Lanka

2022

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

අධ්‍යාපන අමාත්‍යාංශය,
නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය

கல்வி அமைச்சு
திறன் அபிவிருத்தி மற்றும் தொழில்சார் கல்வி பிரிவு

Ministry of Education,
Skills Development & Vocational Education Division

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව හා ගිණුම්

2022

අධ්‍යාපන අමාත්‍යාංශය

නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය

කාක දුපත, මට්ටක්කුලිය, කොළඹ 15.
දුරකථන - 011-4346973 ෆැක්ස් - 011-2525103

විද්‍යුත් තැපෑල : oceanuniversity@ocu.lk

වෙබ් අඩවිය: www.ocu.lk

දැක්ම

සමුද්‍ර, සමුද්‍රීය හා ධීවර අංශ සඳහා නව්‍ය විසඳුම් ලබාදීම.

මෙහෙවර

කලාපයේ සමුද්‍ර හා ධීවර අධ්‍යාපනයේ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානය වීම.

විශ්වවිද්‍යාලයේ අරමුණු

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 11 වන කොටසේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමේ අරමුණු පහත අයුරින් දක්වා ඇත.

01. ධීවර ,සමුද්‍ර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම.

02. යම් ප්‍රදේශයක මිනිස්බල අවශ්‍යතා සපුරාලීම අරභයා ධීවර හා සමාන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන පාඨමාලා සඳහා අවස්ථා ලබා දීම.

03. ධීවර හා සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන් අතර ධීවර, සමුද්‍ර සහ සමුද්‍රීය අංශවලට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම.

04. ධීවර, සාගර විද්‍යාත්මක,සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ව්‍යාප්ත පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම.

05. විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය සහ තාක්ෂණික පාඨමාලා සැපයීම.

06. ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට ඇති දක්ෂතාවය සහ හැකියාව මත පදනම්ව ඉංජිනේරු ශිල්පය, විද්‍යාත්මක, තාක්ෂණික සහ වෘත්තීමය අධ්‍යාපනය සහ පුහුණුවීමේ පද්ධති යන ක්ෂේත්‍රවල ප්‍රගති සංවර්ධනය සඳහා විධිවිධාන සැළැස්වීම.

07. ජාතික වෘත්තීයමය සුදුසුකම් ඇති තැනැත්තන් සඳහා අධ්‍යාපන පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම සහ ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල ඔවුන්ගේ ප්‍රවීණත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ ශාස්ත්‍රීය සුදුසුකම් අත්කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම.

උපකුලපති පණිවුඩය



ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ශ්‍රී ලාංකීය ආර්ථික සංවර්ධනයේ නීල හරිත ආර්ථිකයක් උදෙසා ධීවර, සමුද්‍ර සහ සමුද්‍රීය ක්ෂේත්‍රයන්හී මානව සම්පත, දැනුම හා කුසලතාව වර්ධනය කිරීමට නායකත්වය ගෙන දායකත්වය සැපයූ 2022 වසර පිළිබඳව උපකුලපති වශයෙන් සටහනක් තැබීමට ලැබීම භාග්‍යයක් ලෙස සළකමි.

විශ්වවිද්‍යාලය පශ්චාත් උපාධි ප්‍රදානය සහ දුරස්ථ අධ්‍යයන අවස්ථා ලබා දීමේ කාර්යය සඳහා මං පෙත් විවර කර ගැනීම අරභයා මූලික ප්‍රවිෂ්ඨයක් ලෙස සැපයුම් දාම කළමනාකරණ තාක්ෂණවේදී උපාධි පාඨමාලා (B.Tech in Supply Chain Managment) විෂය නිර්දේශ සැකසීම ද, පර්යේෂණ පදනම් කර ගත් Ph.D.M.Phil.පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරීම සහ ශාස්ත්‍රීය කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ආයතන ව්‍යුහය තුළ ඒකක ස්ථාපිත කිරීම ද 2022 වසර තුල තැබූ සාධනීය පියවරයන් ලෙස සතුටින් සඳහන් කරමි. එසේම, සාගර විශ්වවිද්‍යාලයීය තෙවන උපාධි ප්‍රදානෝත්සවය මාර්තු මාසයේදී පැවැත්වීමට හැකිවීම උපාධිලාභී සිසු දරු දැරියන්ගේ අපේක්ෂා මල්ඵල ගැන්වීමට පිටිවහලක් වනු ඇත. තවද,විශ්වවිද්‍යාලයීය ගීතය මෙම වසර තුළදී පැවැති තෙවන උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේදීම එළි දැක්වීමට ලැබීමද සැමරුම් සටහනක් වශයෙන් සඳහන් කිරීමට කැමැත්තෙමි.

වෙළඳ හා නාවික අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාවේ රැකියාගත පුහුණු අවශ්‍යතාවයක් ලෙස අඛණ්ඩ මුදා හැරීමේ සහතිකය (Continuation Discharge Certificate - CDC) ලබාදීමේ හැකියාව ඇති පුහුණු ආයතනයක් ලෙස පිළිගැනීමට ලක්වීමද වසර තුළදී ලබා ගත් සුවිශේෂී ජයග්‍රහණයක් වේ.

විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම හා පර්යේෂණ පැතිකඩ වර්ධනය සඳහා ක්‍රමෝපායන් තුළ විශ්වවිද්‍යාලයීය පර්යේෂණ දැනුම බාහිර පාර්ශවයන් වෙත බෙදා හැරීම් අවස්ථා 2022 වසර තුළ අඛණ්ඩව ඉදිරියට ගෙනයාමට ලැබීම විශ්වවිද්‍යාලයීය ඉදිරි වර්ධනය සඳහා හේතුපාදක විය.

විශ්වවිද්‍යාලයීය වෘත්තීය තාක්ෂණ විෂය ක්ෂේත්‍රයන්ට අදාලව පෙර දැනුම ඇගයීම (Recognition of Prior Learning (RPL) ක්‍රමය මඟින් NVQ සහතික ප්‍රදානය කිරීම සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව අවසර ලබා දී ගිවිසුම් ගතවීම මඟින් 2022 වසර තුළදී ප්‍රාදේශීය මධ්‍යස්ථාන පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව වර්ධනය කර වැඩි පුහුණු අවස්ථා තුළ ආර්ථිකයට වැඩදායී පුහුණු ශ්‍රමිකයින් බිහිකිරීමට හැකිවීම ද අගය කොට සළකමි.

වෘත්තීය තාක්ෂණ අංශයේ දුරස්ථ අධ්‍යයන අවස්ථා ආරම්භය සටහන් කිරීම මීගමුව ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ මාර්ගගත ඩිප්ලෝමා පාඨමාලා හඳුන්වා දීම මඟින් සිදු විම, එම අංශයේ ප්‍රගමනය සඳහා පාදක වූ කරුණක් ලෙස සටහන් තබමි.

විශ්වවිද්‍යාලයේ වෘත්තිය තාක්ෂණ අංශය යටතේ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හී පාඨමාලා හැදෑරූ ඩිප්ලෝමාධාරී සිසුන් සඳහා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2022 වර්ෂයේදී පැවැත්වීමට හැකිවීම විශ්වවිද්‍යාලයේ වැදගත් සිදුවීමකි. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ප්‍රතිපාදනය කරන ලද වෘත්තීය තාක්ෂණ පාඨමාලා පැවැත්වීමට ප්‍රාදේශීය මධ්‍යස්ථාන කටයුතු කිරීම, විශ්වවිද්‍යාලයේ පාඨමාලා දේශීය හා විදේශීය වෘත්තීය වෙළඳපොල තුළ පිළිගැනීමට ලක්වන බවට සහතිකයකි.

උසස් අධ්‍යයන හා වෘත්තීය තාක්ෂණ පාඨමාලා හදාරන සිසුන් සඳහා ණය යෝජනා ක්‍රම මඟින් අධ්‍යාපන අවස්ථා සඳහා පහසුකම් සපයන ලද අතරම,රේඛීය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක **"නිපුණතා සිසු සවිය"** ශිෂ්‍යාධාර වසර තුලදී ලබාදීම අඩු ආදායම්ලාභී වෘත්තීය පුහුණු අවස්ථා අපේක්ෂා කරන්නන්ගේ උනන්දුව වැඩි කිරීමට දායක වී ඇත.

අධ්‍යයන,අනධ්‍යයන සහ ශිෂ්‍ය ධාරිතා සංවර්ධන කාර්යයන් ලෙස කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයක් (SDC) ස්ථාපිත කිරීම,කොරියානු නාවික සහ සාගර විශ්වවිද්‍යාලය සමඟ (KMOU) ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් හා විශ්වවිද්‍යාලයීය අනධ්‍යයන කාර්ය මණ්ඩල නිළධාරීන් 12 දෙනෙකු කොරියානු ව්‍යාපෘති ආධාර යටතේ විදේශ අත්දැකීම් හුවමාරු වැඩසටහන් සඳහා යොමු කිරීමට අවස්ථාව ලැබීමත් උසස් අධ්‍යයන කටයුතු සඳහා පරිත්‍යාග ලෙස ලද භාණ්ඩ භාවිතයට හැකිවීමත් වසර තුල සිදු වූ වැදගත් සිදු වීම් ලෙස සටහන් තබමි.

මට්ටක්කුලිය පැරණි ගොඩනැඟිලි පරිශ්‍රය පිහිටි ඉඩම සඳහා හිමිකම් සහතිකය ලබා ගැනීම දීර්ඝ කාලයක් නොවිසඳී පැවැති පරිපාලනමය ගැටළුවක් නිරාකරනය කරගැනීමට හැකිවීමකි. එය විශ්වවිද්‍යාලය අයත් භූමි පරිශ්‍රයේ හිමිකම තහවුරු වීමක් ලෙසද සැළකිය හැක.එසේම විශ්වවිද්‍යාලයීය අධ්‍යයන සහ පර්යේෂණ ධාරිතාව වර්ධනය සඳහා කොරියානු EDCF සහනදායී ණය පහසුකම් ලබා විශ්වවිද්‍යාලය ගොඩනැඟීමේ ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොරියානු රජයේ තාක්ෂණික හා මූල්‍යමය ආධාර ලබා ගැනීමට අවස්ථාව උදාකර ගැනීමට හැකිවීම ද අතිශය වැදගත් කරුණකි.

විශ්වවිද්‍යාලයීය විවිධ අංශයන්හී ක්‍රියාකාරිත්වය පිළිබඳ අභ්‍යන්තර විගණන අංශය විගණනයෙන් සිදු කර යෝජනා ඉදිරිපත් කිරීමත්, විගණිත අවසන් ගිණුම් සඳහා ප්‍රකාශිත විගණිත මතයන් මඟින් මූල්‍ය අංශය රාජ්‍ය මුදල් නිසි කළමනාකාරිත්වයකින් යුතුව යෙදවීම නිරූපණය වීම ද තුළ පවත්නා පද්ධතීන් සාධනීයව ඇගයීම් කර ඇති බවට තහවුරු වීමක් ලෙස සැළකිය හැක.

අභියෝග මධ්‍යයේ වුවද, 2022 ඵලදායී වසරක් කර ගැනීම සඳහා දායක වූ පාලන මණ්ඩලය,ශාස්ත්‍රීය සභාව ඇතුලු සමස්ත කාර්ය මණ්ඩලයට ද මාගේ කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතරම,2023 වසර ජයග්‍රාහී පියවරයන් වැඩි අවස්ථාවන් සඳහා යොමු කරවන වසරක් ලෙස ක්‍රියාත්මක කරනු බවටත් සටහන තබමි.

මහාචාර්ය වසන්ත රත්නායක,Ph.D
උපකුලපති,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

පටුන

01. පාලන මණ්ඩලය

02. ශාස්ත්‍රීය සභාව

03. දළ විශ්ලේෂණය

03.1 ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ ආරම්භය ,විකාශය සහ අරමුණු

03.2 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ, කාර්යභාරය සහ සේවා දායකත්වය

04. අධ්‍යයන අංශ

04.1 උසස් අධ්‍යයන

04.2 වෘත්තීය තාක්ෂණ

05. පාලන අංශය

06. අභ්‍යන්තර විගණන අංශය

07. ශේෂ පත්‍රය සහ ආදායම් වියදම් ගිණුම්

08. විගණකාධිපති වාර්තාව

09. විගණකාධිපති වාර්තාවට කරන ලද පැහැදිලි කිරීම්

01. පාලන මණ්ඩලය

2014 අංක 31 දරණ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 19 (1) උප වගන්තිය යටතේ පාලන මණ්ඩලය පිහිටුවා ඇත.

නිල බලයෙන් පත්වන	
මහාචාර්ය ආර්.එම්. වසන්ත රත්නායක මහතා	සභාපති: උපකුලපති
ආචාර්ය එච්.බී. ජයසිරි මහතා	පීඨාධිපති, ඉංජිනේරු හා කළමනාකරණ පීඨය
ආචාර්ය එම්.එෆ්.එම්. ෆයිරෝස් මහතා	පීඨාධිපති ,ධීවර හා සාගර විද්‍යා පීඨය (2019.09.12-2022.09.11)
ආචාර්ය එම්.පී. කුමාර මහතා	පීඨාධිපති (වැ.බ.),ධීවර හා සාගර විද්‍යා පීඨය (2022.09.12-2022.12.11)
ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී. ලංකා වික්‍රමසිංහ මහත්මිය	පීඨාධිපති (වැ.බ.) ,ධීවර හා සාගර විද්‍යා පීඨය (2022.12.12)
(1) සමන්ති මිහිදුකුල මහත්මිය (2) එස්. එම්.එස්.ඩී. ගුණසිංහ මහතා	(1) අතිරේක ලේකම් (පාලන), (2022.01.26) (2) අධ්‍යක්ෂ (සැපයුම් හා ප්‍රසම්පාදන) , (2022.08.10) නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
(1) එස්.සී. සේනාරත්න මහතා (2) එච්.පී. සෝමතිලක මහතා	(1) නියෝජ්‍ය අධ්‍යක්ෂ, 2021.02.28 (2) අධ්‍යක්ෂ, 2022.03.31) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
(1) වී. වසන්තා කුමාරී (2) එස්.ඩී.එල්. සිල්වා මහත්මිය (3) ජී.එම්.ආර්.ඩී. අපොන්සු මහතා	(1) ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, 2021.03.30 (2) අතිරේක ලේකම් (පාලන), 2022.03.21 (3) අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) ,2022.11.25 උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
අජිත් සෙනෙවිරත්න මහතා	අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ නාවික ලේකම් කාර්යාලය
ඉංජිනේරු සනත් පනවෙන්නගේ මහතා	පාලන මණ්ඩල සාමාජික, සහකාර අධ්‍යක්ෂ, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය
ආර්.ඒ.ඩී.එස්. රණතුංග මහතා	අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණික), ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය
(1) ඩබ්.බී.එම්.ඊ.ඩී. බස්නායක මහතා (2) ඒ.ටී. උපාලි කැප්පෙටිපොළ මහතා	(1) සභාපති, (2021.07.29) (2) සභාපති, (2022.11.23) වෘත්තීය පුහුණු අධිකාරිය
(1) මහාචාර්ය නවරත්න රාජා මහතා (2) මහාචාර්ය ජයන්ත විජේරත්න මහතා	(1) සභාපති, (2020.05.12) (2) සභාපති, .(2022.06.16) ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය
(1) තරංග නලීන් ගම්ලත් මහතා (2) ඩබ්. රුචික අමරසේකර මහතා	(1) සභාපති, (2020.05.12) (2) සභාපති,(2022.11.23) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය
ආචාර්ය කේ.ඒ. ලලිතධීර මහතා	අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
පත්කළ සාමාජික	
ආචාර්ය එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
ඉංජිනේරු ඩී.වී. අබේසිංහ මහතා	පාලන මණ්ඩල සාමාජික,කොළඹ නැව් තාටාකාංගනය
මහාචාර්ය රංජිත් සේනාරත්න මහතා	පාලන මණ්ඩල සාමාජික,සභාපති, ජාතික විද්‍යා පදනම
ආරියසීල වික්‍රමනායක මහතා	පාලන මණ්ඩල සාමාජික
ආරියසිරි විතානගේ මහතා	පාලන මණ්ඩල සාමාජික
හෙක්ටර් හේමචන්ද්‍ර මහතා	පාලන මණ්ඩල සාමාජික
සාලිය වික්‍රමසූරිය මහතා	පාලන මණ්ඩල සාමාජික
හේමන්ත රත්නායක මහතා	ලේකම්: ලේඛකාධිකාරී

02. ශාස්ත්‍රීය සභාව

2014 අංක 31 දරණ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 24 (1) උප වගන්තිය යටතේ ශාස්ත්‍රීය සභාව පිහිටුවා ඇත.

මහාචාර්ය ආර්.එම්. වසන්ත රත්නායක මහතා	සභාපති : උපකුලපති
ආචාර්ය එච්.බී. ජයසිරි මහතා	පීඨාධිපති,ඉංජිනේරු හා කළමනාකරණ පීඨය
ආචාර්ය එම්.එෆ්.එම්. ෆයිරෝස් මහතා	පීඨාධිපති (2019.09.12 - 2022.09.11),ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
ආචාර්ය එම්.පී. කුමාර මහතා	පීඨාධිපති (වැ.බ.) (2022.09.12 - 2022.12.11) , ධීවර හා සාගර විද්‍යා පීඨය
පී.යූ.අයි. පෙරේරා මහතා	අධ්‍යක්ෂ (පුහුණු),ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
හේමන්ත රත්නායක මහතා	ලේකම්: ලේඛකාධිකාරී
එච්.කේ.ආර්. තුෂාර මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධි අංශය , ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී,සාගර විද්‍යා විද්‍යාවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී. ලංකා වික්‍රමසිංහ මහත්මිය	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී, ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
ආචාර්ය එන්. දුෂානි මහත්මිය	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී, ධීවර හා සමුද්‍රීය විද්‍යාවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
ශමාලි රත්න ශ්‍රී මහත්මිය	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී, වෙරළ සහ නාවික සම්පත් කළමනාකරණ උපාධි අංශය,ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
නලින් ද අල්විස් මහතා	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී, නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
ඒ.එච්.එස්. වීරකෝන් මහතා	උසස් අධ්‍යයන අංශ ප්‍රධානී, නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධි අංශය,ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
ආෂික් රසුල් මහතා	කථිකාචාර්ය, නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

03. දළ විශ්ලේෂණය

03.1 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ආරම්භය ,විකාශය සහ අරමුණු



ශ්‍රී ලංකාවේ ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා විද්‍යාත්මක, තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කර දැනුම ලබා දී රටේ සංවර්ධනය උදෙසා දායකත්වය දීමේ කාර්යභාරය 2014 අංක 31 දරන පනතින් ස්ථාපිත ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය විසින් ඉටු කරනු ලැබේ.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය දක්වා වූ ගමනේ මූලාරම්භය සටහන් වනුයේ මීගමුව ප්‍රදේශයෙනි. 1963 වර්ෂයේදී මීගමුව ධීවර පුහුණු ආයතනය වශයෙන්ද, 1972 වර්ෂයේදී තංගල්ල, මඩකලපුව, යාපනය ප්‍රදේශ වලින් ආරම්භ වී 1975 වර්ෂයේ මට්ටක්කුලියද, 1993 වර්ෂයේදී ත්‍රිකුණාමලය ද ලෙස ධීවර පුහුණු මධ්‍යස්ථාන 06 ක ක්‍රමික විකාශයකින් පසු 1999 වර්ෂයේදී ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත මඟින් 1999 දෙසැම්බර් මස 20 වැනි දින සිට ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනය නමින් ස්ථාපිත වී 2006 වර්ෂයේදී ගාල්ල සහ 2008 වසරේදී කළුතර උතුර ප්‍රදේශයේ නව ධීවර හා නාවික ඉංජිනේරු විද්‍යාල 02 ක් ව්‍යාප්ත විය. කළුතර උතුර ප්‍රදේශයේ ස්ථාපිත ධීවර හා නාවික ඉංජිනේරු විද්‍යාලය 2020 වසරේදී අගෝස්තු මස පානදුර ප්‍රදේශයේ ඉදිකළ නව ගොඩනැගිලි පරිශ්‍රය තුළ ස්ථානගත කරන ලදී. මෙලෙස, ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ ආවරණය වන අයුරින් විහිදුන ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 ක වෘත්තීය පුහුණු අංශය ක්‍රියාත්මක වන අතර පීඨ 02 කින් සමන්විත වූ උසස් අධ්‍යයන අංශය ද එකතුව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල ශ්‍රී ලාංකික ධීවර ක්ෂේත්‍රය, නාවික හා සාගරය පිළිබඳ පර්යේෂණ සඳහා අවශ්‍ය මානව සම්පත සපයන කාර්යභාරයේ නිරත වේ.

2001 වර්ෂයේදී උපාධි පාඨමාලා ප්‍රදානය කිරීම ආරම්භ වීමත් සමඟ 2003 වසරේදී ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී පාඨමාලාවද, නාවික ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව සහ යාත්‍රා ගොඩනැඟීම් සහ නාවික නිර්මාණ ශිල්පී විද්‍යාවේදී පාඨමාලාව ද රජයේ පිළිගත් උපාධි පාඨමාලා වශයෙන් ගැසට් කර ප්‍රකාශයට පත් කරන ලදී.

2014 වසරේදී නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද, 2015 වසරේදී වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද සාගර විද්‍යා විද්‍යාවේදී උපාධි පාඨමාලාව 2019 වසරේදී සහ ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ උපාධි පාඨමාලාව 2020 වසරේදී ද ආරම්භ කරන ලද්දේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය තුල වාණිජ හා කලා ඇතුළු සියලු විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ සමත් වන සිසුන්ට උසස් අධ්‍යයන අවස්ථා ලබා දීම පුළුල් කිරීම සඳහා වේ.

1999 වසරේදී පිහිට වූ ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත අහෝසි කරමින් 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත සම්මත වූ අතර, 2015 වසරේදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පූර්ණ විශ්වවිද්‍යාලයක් ලෙස ස්ථාපනය වීමෙන් දුදරුවන්ට උසස් අධ්‍යයන වරම් සඳහා වැඩි ඉඩකඩක් විවෘත වී ඇත.

03.2 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යභාරය හා සේවා දායකත්වය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යභාරය:

ශ්‍රී ලංකාවේ ධීවර,සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සහ ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණ සහ සමාන ක්ෂේත්‍රවල නියැලි සිටින තැනැත්තන්ගේ විද්‍යාත්මක තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කිරීම සහ එකී ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලා සඳහා ලබාගන්නා උසස් අධ්‍යාපන සුදුසුකම් දේශීය හා විදේශීය පිළිගැනීම සහතික වීම හා දෙනු ලබන දැනුම රටේ සංවර්ධනය උදෙසා භාවිතයට ගැනීම.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය උසස් අධ්‍යයන අංශය සමන්විත වන පීඨ:

01. ධීවර හා සාගර විද්‍යා පීඨය - තංගල්ල
02. ඉංජිනේරු සහ කළමනාකරණ පීඨය -මට්ටක්කුලිය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සතු වෘත්තීය පුහුණු අංශය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08:

තංගල්ල	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, මහවෙල පාර, තංගල්ල
ගාල්ල	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, 284/ඒ, ගාලු පාර , බූස්ස, ගාල්ල
පානදුර	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,දොඹගහවත්ත,උයන්කැලේ පාර,පානදුර
මට්ටක්කුලිය	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කාකදූපත, මට්ටක්කුලිය, කොළඹ15.
මීගමුව	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,වැල්ලවිදිය, මීගමුව
මඩකලපුව	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, නාවලඩි, මඩකලපුව
ත්‍රිකුණාමලය	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කොඩබේ,චීන වරාය,ත්‍රිකුණාමලය
යාපනය	ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, දෙවන හරස් විදිය,ගුරු නගර් ,යාපනය

සේවා දායකත්වය

ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මානව සම්පත් සංවර්ධන කාර්යයන්හි දී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය මගින් පහත සඳහන් කණ්ඩායම් ආයතනයේ ඉලක්ක ගත කණ්ඩායම් ලෙස සලකා සේවා දායකත්වය සපයනු ලැබේ.

- ධීවර,සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රයන්හි නියැලී සිටින්නන්
- ධීවර , සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අලුතින් අවතීර්ණ වන්නන්
- ධීවර , සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ ක්ෂේත්‍රයන්ට අවතීර්ණ වීමට අපේක්ෂා කරන්නන්
- ධීවර, සමුද්‍ර විද්‍යා සහ සමුද්‍රීය තාක්ෂණ විෂයයන් ඉගැන්වීම කරන ආචාර්ය මණ්ඩලය සහ උපදේශකවරුන්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය මධ්‍යස්ථාන

යාපනය



ත්‍රිකුණාමලය





මඩකලපුව





මීගමුව

මට්ටක්කුලිය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

පානදුර





ගාල්ල

තංගල්ල



04. අධ්‍යයන අංශ


04.1 උසස් අධ්‍යයන

සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශය පීඨ දෙකක් යටතේ උපාධි පාඨමාලා අධ්‍යයන අංශ හයක් ඇතුළත්ව ක්‍රියාත්මක වේ. උසස් අධ්‍යයන අංශය යටතේ 2022 වසර තුලදී උපාධි පාඨමාලා 06 ක්, තාක්ෂණවේදී උපාධි පාඨමාලාවක් ද ඇතුළත්ව ක්‍රියාත්මක විය. ධීවර හා සාගර විද්‍යා පීඨය යටතේ ධීවර හා සමුද්‍රීය විද්‍යා, සාගර විද්‍යා සහ ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධි පාඨමාලා පැවැත්වූ අතර, ඉංජිනේරු හා නාවික කළමනාකරණ පීඨය යටතේ නාවික ඉංජිනේරු, නාවික ප්‍රවාහනය සහ සැපයුම් කළමණාකරණ, වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමණාකරණ උපාධි පාඨමාලා ක්‍රියාත්මක විය. 2017 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය විසින් පවත්වන උපාධි පාඨමාලාවන් ගාස්තු අයකිරීමෙන් නිදහස් කර ඇත. නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හා ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා Z අගය (Z-Score) මත පදනම්ව ද අනෙකුත් උපාධි පාඨමාලා සඳහා අභියෝග්‍යතා පරීක්ෂණ ප්‍රතිඵල මත ද ශිෂ්‍ය බඳවා ගැනීම් සිදු කර ඇත.



වගුව අංක 1 - ශිෂ්‍ය ලියාපදිංචිය

අනු අංකය	පීඨය	විද්‍යාවේදී උපාධි වැඩසටහන්	ශිෂ්‍ය සංඛ්‍යාව					
			2017/2018	2018/2019	2019/2020	2020/2021	2021/2022	2022/2023
01	ඉංජිනේරු හා කළමනාකරණ	නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය	40	37	47	50	46	56
02.		නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය	47	53	53	73	83	51
03.		වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධිය	40	45	55	65	54	49
04.	ධීවර හා සාගර විද්‍යා	ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය	41	41	49	59	68	49
05.		සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය			26	23	23	23
06.		ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධිය				40	76	65



වගුව අංක 2 - උපාධිය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව

	උපාධි පාඨමාලා	ශිෂ්‍ය සංඛ්‍යාව					
		2017/2018	2018/2019	2019/2020	2020/2021	2021/2022	2022/2023
01.	නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය	32	36	33	43	38	55
02.	නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය	42	52	51	69	82	50
03.	වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධිය	36	42	49	60	48	47
04.	ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය	21	28	35	48	66	49
05.	සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය	-	-	19	19	15	23
06.	ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධිය	-	-	-	37	73	65

4.1.1 සිසුන් ආයතනික පුහුණුව සඳහා යොමු කිරීම.

ධීවර හා සමුද්‍රීය විද්‍යා උපාධි පාඨමාලාව හදාරා අවසන් වන සිසුන් පාඨමාලාව අවසානයේදී ආයතනික පුහුණුව සඳහා යොමු කරනු ලැබේ. එමගින් සිසුන් හට ක්ෂේත්‍රය හා සම්බන්ධ විවිධ ආයතනයන් සමග සම්බන්ධ වී කටයුතු කිරීමට හැකියාව ලැබී ඇත.මෙම වසරේ සිසුන් 28 (2018/2019 කණ්ඩායම) දෙනෙකු රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ආයතනික පුහුණුව සඳහා යොමු කරන ලදි.

4.1.2 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගුණාත්මකභාවය

වගුව අංක 3 - ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ධීවර හා සාගර විද්‍යා පීඨයේ ආචාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය එම්. එෆ්. එම්. ෆයිරෝස් මහතා	B.Sc., (M. Phil, Ruhuna, Sri Lanka), D. Sc (Shizuoka, Japan)
02.	ආචාර්ය එම්. පී. කුමාර මහතා	B.Sc. (Hons), (Ruhuna, SL), Ph. D (Edinburgh Napier, UK)
03.	ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී.එල් වික්‍රමසිංහ මහත්මිය	B.Sc. (Hons) (Ruhuna, Sri Lanka), M.Sc. (Vrije, Belgium) Ph.D. (ICAR-CIFE, Mumbai, India)
04.	ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා	B.Sc. in Physical Science (Peradeniya, SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (Peradeniya, SL
05.	ආචාර්ය එස්. එන්. දුෂානි මහත්මිය	B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (UiT, Norway), Ph. D scholar (UiT, Norway)
06.	එස්.පී.යූ. ජිනදාස මහතා	B.Sc. in Special in Geology (Peradeniya, SL), (MPhil) Applied Geophysics (Open University Sri Lanka)
කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය එන්. පී. ජී. පුෂ්පිත මහතා	B.Sc. (Hons), (Ruhuna, SL),,MPhil (Ruhuna, SL), M.Sc. (Korea Maritime and Ocean University, Korea, Ph.D. (Ruhuna, SL)
02.	බී.ඒ. එන්. ඉන්දිකා මහත්මිය	B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (Pukyong National University, Korea) M.Sc. in Fisheries and Aquatic Resources Management (Jayawardhanapura, SL)
03.	ඩබ්. ඒ. ඒ. යූ. කුමාර මහතා	B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (James Cook, Australia)
04.	එම්. අයි. යූ. මාණික්කආරච්චි මහත්මිය	B.Sc. (Hons) (Ruhuna, SL), M.Sc. (World Maritime University, Sweden)
05.	ටී.ඩබ්.එස්. වර්ණසූරිය මහතා	B.Sc. (Hons), (Ruhuna, SL)), M.Sc. (Colombo, SL)
06.	ඒම්.අයි.ජී. රත්නසූරිය මහතා	B.Sc. (Hons), (Ruhuna, SL), M. Sc (Pukyong National University, Korea)
07.	ඩබ්.ඒ. ශිරාන් චාමික මහතා	B. Sc (Hons), (Ocean University, SL), M.Sc. (Pukyong National University, Korea)

වගුව අංක 4 -ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ නාවික ඉංජිනේරු හා කළමනාකරණ පීඨයේ ආචාර්ය මණ්ඩලය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්		
01.	ආචාර්ය එච්.බී.ජයසිරි මහතා	B.Sc. in Biological Science (Ruhuna, SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (CIFE, Mumbai, India)
කථිකාචාර්යවරුන්		
01.	එම්.සී.එල් .සොයිසා මහත්මිය	B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management at Kelaniya, SL), Master of Science Korea Maritime and Ocean University
02.	ඊ.ඒ.කේ.කේ. අමරසේකර මහත්මිය	B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management at Kelaniya, SL)
03.	එච්.ඒ.පී.එස්.ජයපාල මහත්මිය	B.Sc. in Degree (Open SL), M.Sc. in Fisheries & Aquatic Resources Management (Sri Jayawardhanapura, SL), Master of Science Korea Maritime and Ocean University
04.	පී.ඒ.එස්.ඒ. රත්න ශ්‍රී මහත්මිය	B.Sc. (Special) in Aquatic Science (Sri Jayawardhanapura, SL), M.Sc. in Environmental Science (Open University, SL)
05.	ඒ. සුරේෂ් මහත්මිය	B.Sc. (Special) in Environmental Sciences, Vauniya Campus of the (University of Jaffna, SL), M.Sc. in Environmental Science (Peradeniya, SL), Master of Science Korea Maritime and Ocean University
06.	ඩී.එස්.මානගේ මහත්මිය	B.Sc. (Hons) in Transport & Logistics Management (Moratuwa, SL), MBA in Business Administration
07.	එච්. ඩී.එම්.එම්.පුස්සැල්ල මහත්මිය	B.Sc. (Hons) in Business Administration (Peradeniya, SL), M.Sc. in Management university of Sri Jayawardhanapura
08.	ටී.පී.ජී.එන්.අසන්තද අල්විස් මහතා	B.Sc. (Hons) in Transport & Logistics Management (Moratuwa, SL), Master of Science Korea Maritime and Ocean University
09.	එම්.ජේ.එම්.ඒ.රසුල් මහතා	B.Sc. in (Ruhuna, SL), MSc. (Agder, Norway), M.Sc. Master of Engineering in Marine System Engineering. Major: Marine Electrical and Electronics (Korean Maritime Ocean University)
10.	ඒ.එච්.එස්.අයි. වීරකෝන් මහතා	B.Sc. in Ocean University of Sri Lanka, M.Sc. Master of Science in Mechanical Engineering. Major: Ocean Energy and Fluid Dynamics (Korean Maritime Ocean University)
11.	ජී.ඒ.එස්. චතුරි ගනේපොල මෙනෙවිය	Master of Business Administration, University of Colombo, Bachelor of Business Administration in Business Economics, University of Colombo Passed Finalist in Charted Institute of Management Accountants (CIMA)
12.	ඩබ්.පී.ඩබ්.අංජලිකා මහත්මිය	B.A. in Economics (Special) Degree University of Sabaragamuwa
13.	ඒච්.ඒ.ඩී. නිසඟ නුවන්ත මහතා	B.Sc. in Marine Engineering, Ocean University of Sri Lanka
14.	සඳුන් කෞශල්‍ය විමලරත්න මහතා	B.Sc. in Marine Engineering, Ocean University of Sri Lanka

4.1.3 අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කළ පර්යේෂණ හා ප්‍රකාශන 2022

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් යොමු ගත සුවිගත වාර සඟරා ලිපි සහ යොමු ගත සුවි ගත නොකළ වාර සඟරා ලිපි ප්‍රකාශයට පත් කර ඇත. කාර්ය මණ්ඩලයේ සියලුම ප්‍රකාශ පිළිබඳ සාරාංශයක් වගුවේ දක්වා ඇත.

වගුව අංක 5 : අධ්‍යයන කාර්ය මණ්ඩලය සිදු කළ පළ කිරීම්

පීඨය		ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
				දේශීය	විදේශීය
ධීවර හා සාගර විද්‍යා පීඨය	1	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව			4
	2	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත නොකළ යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව			
	3	සම්මන්ත්‍රණ කාර්ය සටහන්	3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව	24	02
			3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව		
	4	පළ කළ ග්‍රන්ථ පරිච්ඡේද			1
	5	විශේෂඥ ක්ෂේත්‍රවල පළ කළ ග්‍රන්ථ/පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්		
			5.2 කතෘවරයෙක් මඟින්		
ඉංජිනේරු සහ කළමනාකරණ පීඨය	1	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව			
	2	විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත නොකළ යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව			
	3	සම්මන්ත්‍රණ කාර්ය සටහන්	3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව	02	
			3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව	24	
	4	පළ කළ ග්‍රන්ථ පරිච්ඡේද			02
	5	විශේෂඥ ක්ෂේත්‍රවල පළ කළ ග්‍රන්ථ/පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව	5.1 ප්‍රකාශකයෙක් මඟින්		
			5.2 කතෘවරයෙක් මඟින්		

වගුව අංක 6 : අනධ්‍යයන කාර්ය මණ්ඩලය සිදු කළ පළ කිරීම්

විධායක කාර්ය මණ්ඩලය		ප්‍රකාශන කාණ්ඩය		සංඛ්‍යාව	
				දේශීය	විදේශීය
	3	සම්මන්ත්‍රණ කාර්ය සටහන්	3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව		
			3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව	02	

4.1.4 ප්‍රගතිය

❖ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය තෙවන උපාධි ප්‍රදානෝත්සවය 2022.03.23 වැනි දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වා උපාධි ප්‍රදානය සිදු කිරීම.





❖ නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාව සඳහා අඛණ්ඩ මුදා හැරීමේ සහතිකය CDC (Certification) ලබා ගැනීමට වෙළඳ හා නාවික අමාත්‍යාංශයේ අනුමැතිය 2022.04.18 දින හිමිවීම. ඒ අනුව, වෙළඳ හා නාවික අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පුහුණු ආයතනයක් ලෙස පිළිගැනීම.

❖ **"පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය "(Centre for Postgraduate Studies)** ස්ථාපනය කර, පශ්චාත් උපාධි ප්‍රදානයන් සඳහා නිර්දේශයන් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම.

❖ පර්යේෂණ පදනම් කරගත් Ph.D, Mphil පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කර, ශිෂ්‍ය ලියාපදිංචිය සිදු කිරීම.

❖ වෙරළ සම්පත් ආර්ථික විද්‍යාව හා කළමනාකරණය (MSc in Coastal Resource Economics and Management) යන පශ්චාත් උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය විශේෂඥ උපදෙස් මත සකසා ශාස්ත්‍රීය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

❖ සැපයුම් දාම කළමනාකරණ තාක්ෂණවේදී උපාධි පාඨමාලාව (B.Tech in Supply Chain Management) විෂය නිර්දේශය සකසා අවසන් කර, ශාස්ත්‍රීය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම.

❖ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා IMarEst සාමාජිකත්වය යාවත්කාලීන කිරීම.

❖ අඛණ්ඩ මුදා හැරීමේ සහතිකය ලබා ගැනීම සඳහා මූලික අවශ්‍යතාවයක් ලෙස නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාව සඳහා ISO 9001-2015 (Bureau Veritas Certification) තත්ත්ව සහතිකය වසර 03 ක කාලසීමාවක් සඳහා ලබා ගැනීම.

❖ නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව සඳහා වෘත්තීය සාමාජිකත්වය යාවත්කාලීන කර, ප්‍රමිති තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර වරලත් ලොජිස්ටික් හා ප්‍රවාහන සාමාජිකත්ව ආයතනය (Charted Institute of Logistics and Transporation Membership - CILT) සමඟ සම්බන්ධ වීම.

❖ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පිළිගැනීම සාගර විද්‍යා සහ ජලජීවී වගා සහ මුහුදු ආහාර තාක්ෂණ පාඨමාලා සඳහා 2022 මාර්තු මසදී ලබා ගැනීම.

❖ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රකාශන දෙවන (II) වෙළුම ප්‍රකාශයට පත් කිරීම සඳහා මූලික පියවර ගැනීම.

❖ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ හතරවන පර්යේෂණ සමුළුව (Research Symposium) 2022 නොවැම්බර් මස 17 වැනි දින තංගල්ල ධීවර හා සාගර විද්‍යා පීඨයේදී මාර්ගගත ක්‍රමය මඟින් පැවැත්වීම.





❖ ශාස්ත්‍රීය කටයුතු වැඩි දියුණු කිරීම සඳහා නව කේන්ද්‍ර සහ ඒකක (Centers and Units) පිහිටුවීම.

❖ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් සංවර්ධනය සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයක් (SDC) පිහිටුවීම සහ කාර්ය මණ්ඩලය සඳහා ‘‘නිවැරදි ආකල්ප තුලින් වඩා හොඳ කාර්ය සාධනයක් සඳහා’’ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

❖ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීම් මධ්‍යස්ථානයක් (Center for Quality Assurance – CAQ) පිහිටුවීම.

❖ උසස් අධ්‍යයන සිසුන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදාන වැඩසටහනක් IMarEst ආයතනය මඟින් ක්‍රියාත්මක කිරීම.

❖ දුරස්ථ අධ්‍යාපන අවස්ථා (Disterence Learning) පුළුල් කිරීම සඳහා Centre for Open and Distance Learning ආරම්භ කිරීම.

❖ ශිෂ්‍ය ප්‍රජාව සඳහා නිදහස් දුම්රිය ගමන් බලපත්‍ර පහසුකම්/ අධ්‍යාපනික ණය යෝජනා ක්‍රමයක ප්‍රතිලාභ ලංකා බැංකුව මඟින්/ මහජන බැංකු අධ්‍යාපනික ණය යෝජනා ක්‍රමය යටතේ ලැප්ටොප් පරිගණක මිළදී ගැනීමේ අවස්ථාව මෙම වසරේදී ද ලබා දීමට කටයුතු කිරීම.

❖ ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධිය හදාරනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් 35 පමණ පර්යේෂණ ව්‍යාපෘති (Mini Project) වසර තුළදී අවසන් කිරීම.

❖ වසර තුළදී ධීවර හා සාගර විද්‍යා පීඨයේ ශිෂ්‍ය ක්‍රියාකාරකම් ලෙස කාර්ය මණ්ඩලය හා සිසුන් සඳහා සෞඛ්‍ය කඳවුරක් පැවැත්වීම/ වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම/ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම සහ ක්‍රීඩා හැකියාවන් හා සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා ක්‍රිකට් තරඟාවලියක් පැවැත්වීම.

❖ කැලිෆෝනියාවේදී පැවැති 45 වැනි වාර්ෂික සමුළුව (45 th Annual Larval Fish Conference) සඳහා රටවල් විසින් ඉදිරිපත් කළ පර්යේෂණ අතරින් හොඳම පර්යේෂණ ඉදිරිපත් කිරීම් අතරට ධීවර හා සාගර විද්‍යා පීඨයේ M.A.S රන්ජුල සිසුවා තේරී පත්වී සංචාරක සම්මානයක්ද Grace Klein-MacPhee Student Travel Award of $1,000 (USD) හිමි කර ගැනීම, වසර තුළදී ලද ශිෂ්‍ය ජයග්‍රහණයක් ලෙස සැළකිය හැක.

ජාත්‍යන්තර සහයෝගීතාවයන්

01. විශ්වවිද්‍යාලය තුළ පශ්චාත් උපාධි ප්‍රධාන ඒකකයක් (FGSC) ස්ථාපිත කිරීම සහ පශ්චාත් උපාධි ප්‍රධාන වැඩසටහන් ඇරඹීම සඳහා IUCN ආයතනය සමඟ සාගර විශ්විද්‍යාලය අවබෝධතා ගිවිසුම් ගතවීම.

02. කොරියාවේ ජාතික කොරියා නාවික හා සාගර විශ්වවිද්‍යාලය (National Korea Maritime & Ocean University) සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය අතර, අධ්‍යාපනික සහයෝගිතා ගිවිසුමට එළඹීම 2022.03.21 දින සිදුකර, ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

03. සහයෝගීතා පර්යේෂණ සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා චීනයේ South China Sea Institute of Oceanology ආයතනය සහ සාගර විශ්වවිද්‍යාලය අවබෝධතා ගිවිසුම් ගතවීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගැනීම.

04. සහයෝගීතා පර්යේෂණ සම්බන්ධව ක්‍රියා කිරීම සඳහා ඇමරිකා එක්සත් ජනපද Notre Dame විශ්වවිද්‍යාලය සහ සාගර විශ්වවිද්‍යාලය අවබෝධතා ගිවිසුම් ගතවීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගැනීම.

4.2 වෘත්තීය තාක්ෂණ අංශය



ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය වෘත්තීය තාක්ෂණ අංශය ප්‍රාදේශියව ස්ථාපිත මධ්‍යස්ථාන 08 කින් සමන්විත වේ. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිකුත් කරනු ලබන වෘත්තීය සුදුසුකම් සහිත පාඨමාලා ප්‍රාදේශිය මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක කිරීම තුළ දසත විහිදුනු සිසු දරුදැරියන්ගේ වෘත්තීය අධ්‍යාපනය ඉහල නැංවීම සිදු කරනු ලැබේ.

4.2.1. 2022 වර්ෂය තුලදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය තාක්ෂණ අංශ ප්‍රාදේශීය විද්‍යාල (08) පාඨමාලා ප්‍රගතිය

2022 වසර තුළ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව :

අංශය	නිපුණතා සම්මත මට්ටම NVQ/ NNVQ	බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව				එකතුව
		පූර්ණකාලීන		අර්ධකාලීන		
		පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	
ධීවර හා ජලජීවී වගාව	NVQ	196	181	0	0	377
	NNVQ	684	18	17	4	723
සමුද්‍ර හා නාවික විද්‍යාව	NVQ	264	79	0	0	343
	NNVQ	0	0	0	0	0
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	NVQ	19	35	0	0	54
ජංගම පුහුණු	NNVQ	161	27	0	0	188
එකතුව		**1324**	**340**	**17**	**4**	**1685**

2022.12.31 දිනට අධ්‍යාපනය ලබමින් සිටින ශිෂ්‍ය සංඛ්‍යාව:

ප්‍රාදේශීය මධ්‍යස්ථානය	පාඨමාලාව	NVQ level	පාඨමාලා සංඛ්‍යාව	ශිෂ්‍ය සංඛ්‍යාව	සය මාසික වෘත්තීය පුහුණුවට යොමුකර ඇති ශිෂ්‍ය සංඛ්‍යාව	2022.12.31 දිනට අධ්‍යාපනය ලබමින් සිටින ශිෂ්‍ය සංඛ්‍යාව	
මීගමුව	ඩිප්ලෝමා	5	6	79	24	103	**246**
	සහතික පත්‍ර	4	9	67	38	105	
	Continuous Discharge Certificate (CDC)පාඨමාලා	-	-	-	-	0	
	ජංගම පුහුණු	-	2	38	-	38	
ත්‍රිකුණාමලය	ඩිප්ලෝමා	5	1	13	-	13	**51**
	සහතික පත්‍ර	-	2	25	13	38	
	Continuous Discharge Certificate (CDC) පාඨමාලා	-	-	-	-	0	
	ජංගම පුහුණු	-	-	-	-	0	
ගාල්ල	ඩිප්ලෝමා	5	3	58	23	81	**256**
	සහතික පත්‍ර	3/4	10	126	49	175	
	Continuous Discharge Certificate (CDC) පාඨමාලා	-	-	-	-	0	
	ජංගම පුහුණු	-	-	-	-	0	
තංගල්ල	ඩිප්ලෝමා	5	4	89	-	89	**192**
	සහතික පත්‍ර	3/4&Non NVQ	5	75	-	75	
	Continuous Discharge Certificate (CDC) පාඨමාලා	ISO	2	28	-	28	
	ජංගම පුහුණු	-	-	-	-	0	
යාපනය	ඩිප්ලෝමා	5	2	48	-	48	**77**
	සහතික පත්‍ර	4 Non NVQ	2	29	-	29	
	Continuous Discharge Certificate (CDC) පාඨමාලා	-	-	-	-	0	
	ජංගම පුහුණු	-.	-	-	-	0	
මට්ටක්කුලිය	ඩිප්ලෝමා	5	10	221	28	249	**364**
	සහතික පත්‍ර	4	4	42	30	72	
	Continuous Discharge Certificate (CDC) පාඨමාලා	-	2	43	-	43	
	ජංගම පුහුණු	-	-	-	-	0	
පානදුර	ඩිප්ලෝමා	5	8	141	109	250	**250**
	සහතික පත්‍ර	3 & 4	-	-	-	0	
	Continuous Discharge Certificate (CDC) පාඨමාලා	-		-	-	0	
	ජංගම පුහුණු	-	-	-	-	0	
මඩකලපුව	ඩිප්ලෝමා	-	2	35		35	**75**
	සහතික පත්‍ර	3 & 4	2	40	-	40	
	Continuous Discharge Certificate (CDC) පාඨමාලා	-	-	-	-	0	
	ජංගම පුහුණු	-	-	-	-	0	
2022.12.31දිනට අධ්‍යාපනය ලබමින් සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව						**0**	**1511**

4.2.2 ප්‍රගතිය

01. ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය වෘත්තීය පුහුණු අංශයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හී ඩිප්ලෝමාධාරී සිසුන් සඳහා පළමු ඩිප්ලෝමා ප්‍රදානෝත්ස්වය 2022.02.17 බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීම.





ඩිප්ලෝමා ප්‍රදානෝත්ස්වයේදී ජලජීවී වගාව හා ජලජ සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව, නාවික හා සැපයුම් කළමණාකරන ඩිප්ලෝමා පාඨමාලාව, සමුද්‍ර යන්ත්‍රෝපකරණ නඩත්තු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව/ නාවික ඉංජිනේරු ඩිප්ලෝමාව (National Diploma in Aquaculture and Aquatic Resources Management,National Diploma in Maritime and Logistics Management,National Diploma in Marine Machinery Maintenance Technology (Marine Engineering Diploma)යන පාඨමාලාවන්හි සිසු සිසුවියන් 233 දෙනකු ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කුලපති මහාචාර්ය ඔස්කාර් අමරසිංහ මහතා අතින් ඩිප්ලෝමා සහතික ලබාගන්නා ලදී.

02. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මගින් වෘත්තීය පුහුණු පාඨමාලා ප්‍රතීතනය (Accreditation) කර ගැනීම.

03. රේඛීය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක **"නිපුණතා සිසු සවිය"** ශිෂ්‍යාධාර ලබා දීම සඳහා වැඩසටහන සමඟ සම්බන්ධීකරණයෙන් වෘත්තීය පුහුණු අංශයේ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම.

04. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මගින් ලබාදෙන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) පහත සඳහන් පාඨමාලාවන්හි ප්‍රතීතන අළුත්කිරීමට කටයුතු කරන ලදී.

- ජලජීවී වගාව හා ජලජ සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - NVQ5
  (National Diploma in Aquaculture and Aquatic Resources Management)
- ජලජීවී වගාව හා ජලජ සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව - NVQ6
  (National Diploma in Aquaculture and Aquatic Resources Management)
- නාවික හා සැපයුම් කළමණාකරන ඩිප්ලෝමා පාඨමාලාව – NVQ5
  (National Diploma in Maritime and Logistics Management)
- මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව – NVQ5
  (National Diploma in Sea food technology)
- සමුද්‍ර යන්ත්‍රෝපකරණ නඩත්තු තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව - NVQ5
  (National Diploma in Marine Machinery Maintenance Technology)

05. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මගින් ලබාදෙන ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ) පෙර දැනුම ඇගයීම් වැඩසටහන් Recognition of Prior Learning (RPL) ක්‍රමයට පහත සඳහන් පාඨමාලාවන්ට ලබාදීමට අදාලව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමග ගිවිසුම් අත්සන් කරන ලදී.

- ❖ ජලජීවී වගා කාර්මික (Aquaculture Technician)
- ❖ ජීවිතාරක්ෂක (Lifeguard) (NVQ Level 3)
- ❖ බෝට්ටු තැනීමේ තාක්ෂණය (Boat Building Technology)
- ❖ ධීවර ආම්පන්න අලුත්වැඩියා සහායක (Fishing Gear Repair Assistant)
- ❖ පාවෙන යාත්‍රා කාර්මික (Floating Vessels Mechanic)
- ❖ ධීවර අස්වැන්න කාර්මික (Fish Harvest Technician)
- ❖ වාප්පු ලිපිකරු (Wharf Clerk)
- ❖ නැව් තටා අධීක්ෂක (Shipyard Supervisor)
- ❖ ස්කුබා කිමිදුම්කරු (Scuba Diver)

06. වසර තුළදී මීගමුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය මඟින් පහත පරිදි සිසු සිසුවියන් රැකියා ගත කර ඇත.

පාඨමාලාව	රැකියාගත කළ ආයතනය	ශිෂ්‍ය සංඛ්‍යාව
ජීවිතාරක්ෂක	ශ්‍රී ලංකා රතු කුරුස සංගමය (Sri Lanka Red Cross Society)	14
ජලජීවී වගා කාර්මික	ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය (NAQDA)	04
	කඩොලාන කෞතුගාරය - Mangroo Museum – Pambala	08
	ලුම්බිණී මින්මැදුර (Lumbini Aquarium)	01
	සීලොන් සී ෆුඩ් කැබින් Ceylon sea food cabin (Pvt) Ltd	01
නාවික හා සැපයුම් කළමණාකරන ඩිප්ලෝමා පාඨමාලාව	ශ්‍රී ලංකා වරාය අධිකාරිය (Port Authority)	16

07. කාර්ය මණ්ඩලයේ සහ අභ්‍යාසලාභීන්ගේ දායකත්වයෙන් මීගමුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් පාඨමාලා හදාරන අභ්‍යාසලාභීන් සඳහා විදේශ රැකියා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහයෝගය සහිතව පැවැත්වීම.





05. පරිපාලන අංශය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය පරිපාලන අංශය විසින් 2022 වසර තුළ පහත සඳහන් ප්‍රගතීන් සාක්ෂාත් කර ඇත.

01. විශ්වවිද්‍යාලයේ මට්ටක්කුලිය පැරුණි ගොඩනැඟිලි පරිශ්‍රය සඳහා ඉඩම් හිමිකම් සහතිකය 2022.06.16 දින ලබා ගැනීම.

02. කොරියන් ආධාර යටතේ පහසුකම් සහිත විශ්වවිද්‍යාල පරිශ්‍රයක් ඉදිකිරීමට අදාළ පාරිසාරික බලපෑම් ඇගයීම් වාර්තාව සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2022.08.19 දින අනුමැතිය ලබාදීම.මෙම පාරිසරික ඇගයීම් වාර්තාව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනයන්ට යටත්ව මහජන දැනගැනීම අදහස් හා යෝජනා / (Public Hearing) ද අදාළ ආයතනයන් වෙත ද යොමු කර,අනුමැතිය ලබා ගැනීම.

03. ලෝක බැංකු ප්‍රධාන යටතේ **"AHEAD"** ව්‍යාපෘතිය හරහා **(**"IEMIS"**)** Integrant Education Management Information System) පරිගණක මෘදුකාංග භාවිතා කිරීමේ වැඩසටහන සඳහා එක් එක් අංශයන් සම්බන්ධ කර එම අංශයන්හී කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.

04. ශ්‍රී ලංකා නාවික හමුදාව සමඟ එකාබද්ධ වී යාත්‍රා අලුත්වැඩියා කටයුතු සඳහා වාර්තාවක් සැකසීම.

පාලන අංශ උප ඒකක ප්‍රගතිය පහත දැක්වේ.

5.1 මානව සම්පත් අංශය

මෙම ආයතනයේ මානව සම්පත් සංවර්ධන අංශය ආයතනයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ හා ඵලදායී කාර්යශූර කාර්ය මණ්ඩලයක් බිහි කිරීමේ අරමුණින්, මානව සම්පත් බඳවා ගැනීම හා සංවර්ධනය සිදු කරයි. සේවක සුබසාධනය ප්‍රමුඛ කොට සලකන අතර,විනය ගරුක කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කාර්ය පද්ධති කළමනාකරණය සිදු කරයි.

සේවක		2022.01.01- 2022.12.31		
		පුරුෂ	ස්ත්‍රී	එකතුව
ජ්‍යෙෂ්ඨ මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	16	13	29
	කොන්ත්‍රාත් පදනම		04	04
	දරන්නාට පෞද්ගලික වනසේ	14	03	17
	අනියම්			
	*එකතුව **(1)***	30	20	50
තෘතීය මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	03	01	04
	දරන්නාට පෞද්ගලික වනසේ	03	00	03
	අනියම්			
	*එකතුව **(2)***	06	01	07
ද්විතීය මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	24	31	55
	දරන්නාට පෞද්ගලික වනසේ	16	03	19
	කොන්ත්‍රාත් පදනම	23	18	41
	*එකතුව **(3)***	63	52	115
ප්‍රාථමික මට්ටම				
	නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව)	51	07	58
	දරන්නාට පෞද්ගලික වනසේ	00	00	00
	*එකතුව **(4)***	51	07	58
සේවක එකතුව (1)+(2)+(3)+(4)		150	80	230

(අ.) කාර්ය මණ්ඩල විස්තර

කාර්ය මණ්ඩලය	වැටුප් කේතය	අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව	පවතින කාර්ය මණ්ඩලය			සත්‍ය කාර්ය මණ්ඩලය	ස්ථිර කාර්ය මණ්ඩල පුරප්පාඩු
			ස්ථිර	තාවකාලික	කොන්ත්‍රාත්		
අධ්‍යයන	U AC	34	26	00	02	28	06
**පෞද්ගලික වන සේ		07	07	00	00	07	00
පුස්තකාල	U AC	03	00	00	00	00	03
පරිපාලන හා මූල්‍ය	U EX 2	20	13	02	00	15	05
අනෙකුත් විධායක	U EX 1	07	07	00	00	07	00
සෞඛ්‍ය	U AS 1	01	00	00	00	00	01
අධ්‍යයන සහායක	AR 1/UMN 3/UMN 2-2	60	12	00	40	52	08
තාක්ෂණ නිලධාරී	U MT	18	04	00	01	05	13
කළමනාකරණ සහකාර	U MN	87	58	00	00	58	29
ප්‍රාථමික	U PL	98	58	00	00	58	40

**අභියාචනා මණ්ඩල තීරණයට අනුව අන්තර්ග්‍රහණයේදී විද්‍යාල කථිකාචාර්ය තනතුරු 07 U AC 3 වැටුප් කේතය යටතේ දරන්නාට පෞද්ගලික වනසේ අනුමත කර ඇත.

(ආ) අධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර

පීඨය	දෙපාර්තමේන්තුව/ප්‍රාදේශීය මධ්‍යස්ථානය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය (විශ්වවිද්‍යාල/ විද්‍යාල) ස්ථිර/පරිවාස	කථිකාචාර්ය (විශ්වවිද්‍යාල/ විද්‍යාල)		කොන්ත්‍රාත් අධ්‍යයන කාර්ය මණ්ඩලය	උපදේශක (විද්‍යාල, සහකාර විද්‍යාල සහ අනෙකුත්)
						ස්ථිර	පරිවාස		
ඉංජිනේරු හා කළමනාකරණ පීඨය				00	12			02	
ධීවර හා සාගර විද්‍යා පීඨය				07	06				

(ඇ) අනධ්‍යයන කාර්ය මණ්ඩල විස්තර

පීඨය/ ප්‍රාදේශීය මධ්‍යස්ථානය	සේවක සංඛ්‍යාව				
	ජ්‍යෙෂ්ඨ	තෘතීය	ද්විතීය	ප්‍රාථමික	කොන්ත්‍රාත්
ප්‍රධාන කාර්යාලය	07	05	20	20	03
මත්ස්‍ය හා සාගර විද්‍යා පීඨය	13	00	10	06	02
ඉංජිනේරු හා කළමනාකරණ පීඨය	12	00	02	02	06
යාත්‍රා නඩත්තු අංශය	00	02	10	00	00
මට්ටක්කුලිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය	02	00	00	02	07
මීගමුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය	01	00	04	05	03
පානදුර ප්‍රාදේශීය මධ්‍යස්ථානය	01	00	03	01	08
ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය	02	00	06	03	05
තංගල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය	04	00	10	09	04
ත්‍රිකුණාමලය ප්‍රාදේශීය මධ්‍යස්ථානය	01	00	02	02	02
මඩකලපුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය	02	00	05	05	02
යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය	01	00	02	03	03

5.2 තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ උපාය මාර්ගයට අනුකූල වීම.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතෙහි 14 වන වගන්තිය ප්‍රකාරව තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ උපායමාර්ගයට අනුකූලව විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන, පුහුණු සහ පරිපාලනමය ක්‍රියාමාර්ග සැළසුම් කර ඇත.

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ විෂය පථයට අදාළව වෙන් කර හඳුනා ගන්නා ලද කාර්යයන් සහ ඉලක්කයන් එම ඉලක්ක කරා ළඟා විය යුතු දර්ශකයන්, සංධිස්ථානයන් සහ ඉලක්ක වෙත ළඟා වීම මැන බැලීම සඳහා වන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට අදාළ දර්ශකයන් ඉදිරිපත් කර ඇත.


ඒ අනුව, රේඛීය අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාලයට අදාළව හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හා දර්ශකයන්ට අදාළව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති/ වැඩසටහන්වලට අදාළ ප්‍රගතිය නියාමනය කරනු ලබයි.

06. අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය අවදානම පදනම් කර ගනිමින් විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීම සඟතික කිරීම සඳහා උපදෙස් ලබා දීම යන ක්‍රියාකාරකම් තුළින් විශ්වවිද්‍යාලයේ වටිනාකම් වැඩි දියුණු කිරීම හා ආරක්ෂා කිරීමට මඟපෙන්වීම සිදු කරනු ලැබේ.

2022 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රගතිය.

- අභ්‍යන්තර විගණන වැඩ සැළැස්ම තුළ ක්‍රියාත්මක කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා 07ක් සම්පාදනය කිරීම හා එහි ප්‍රගති කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- විශේෂ විමර්ෂන 05ක් පැවැත්වීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- විගණන කළමනාකරණ කමිටු 03 පවත්වා ආයතනය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන් සමාලෝචනය කිරීම.



07. අවසන් ගිණුම්

ශ්‍රී ලංකා සාගරවිශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.

	සටහන	2022 දෙසැම්බර්මස31 දිනටඅවසාන		2021 දෙසැම්බර්මස31 දිනටඅවසාන		2021 දෙසැම්බර්මස31 දිනටනැවතසකස්කරනලදඅවසාන	
		රු.		රු.			
වත්කම්							
ජංගම නොවන වත්කම්							
දේපළ පිරියතහා උපකරණ	1	2,197,272,747		623,672,536		625,186,472	
කෙරිගෙනයන වැඩ - ගොඩනැගිලි	1.1	61,855,799.14		4,361,400.00	628,033,936	4,361,400	629,547,872
අස්පෘශ්‍යවත්කම්	1.2	7,460,979.00	2,266,589,525				
ස්ථාවර තැන්පතු		12,291,974		11,658,355			11,658,355
ජංගමවත්කම්			12,291,974		11,658,355		641,206,227
කාර්ය මණ්ඩලණය	2	13,189,183		12,627,161		12,627,161	
ඉන්වෙන්ට්‍රි- ලිපිද්‍රව්‍ය	3	1,918,570		570,731		570,731	
තීන්ත සහ උපකරණ	3.1	187,089				-	
වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ	4	22,376,953		34,261,785		34,261,785	
අවිනිශ්චිතගිණුම		85,433		85,433		85,433	
මුදල් හා මුදල් සමාන දෑ	5	16,534,868	54,292,097	30,877,801	78,422,911	30,877,801	78,422,911
මූළුවත්කම්			**2,333,173,601**		**718,115,202**		**719,629,138**
හිමිකම්හා වගකීම්							
ප්‍රාග්ධන සංචිත	6	12,960,393		11,658,355		11,658,355	
සමුච්චිත අරමුදල	7	809,753,648		788,025,807		790,909,923	
වෙනත්ප්‍රදාන				14,234,250		14,234,250	
රජයේ ප්‍රදාන - AHEAD	7.1	5,076,864		1,628,640		1,628,640	
සමුච්චිත අරමුදල - ආංශික සංවර්ධන වැඩසටහන (SSDP)	8	244,958,829		280,954,073		280,954,073	
සමුච්චිත - අතිරික්තය/(ඌණතාවය)	9	(573,655,678)		(528,338,308)		(529,683,586)	
ප්‍රත්‍යාගණන සංචිතය		1,673,211,343					
බැඳුම්කර - අවලංගු වීමෙන් ලද සංචිත	11	1,732,125					
			2,174,037,524		568,162,817		569,701,655
ජංගමනොවන වගකීම්							
පාරිතෝෂික සඳහා වෙන්කිරීම		86,992,943	86,992,943	79,028,671	79,028,671	79,028,671	79,028,671
ජංගමවගකීම්						-	
උපචිත වියදම්		47,313,085		50,356,737		50,356,737	
ගෙවියයුතු දෑ	10	14,721,063		20,566,974	70,923,711	20,542,075	70,898,812
ගෙවීම් සඳහා වෙන්කිරීම්		10,108,975	72,143,123				
මූළුවගකීම්			**2,333,173,601**		**718,115,202**		**719,629,138**

K.V. ROHINIE VIDYARATNE
DIRECTOR FINANCE
Ocean University of Sri Lanka
Crow Island, Mattakkuliya,
Colombo 15.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය.

	සටහන	2022	2021	2021 දෙසැම්බර් මස 31 දිනට නැවත සකසන ලද ශේෂය
		රු.	රු.	රු.
මෙහෙයුම් ආදායම්				
රජයේ ප්‍රදාන		404,580,000	375,333,000	375,333,000
වෙනත් ආදායම්	11	29,250,010	28,159,493	28,184,393
ආංශික සංවර්ධන අංශය-පුනරාවර්ථන ප්‍රදාන		-	1,187,393	1,187,393
රජයේ ප්‍රදාන පුනරුත්ථාපන හා වෙනත්		-	2,884,115	
මෙහෙයුම් ආදායම්		**433,830,010**	**407,564,001**	**404,704,786**
විලම්භීත ආදායම ක්‍රමක්ෂය ගැළපීම්		91,763,105	89,532,996	89,532,996
		525,593,116	**497,096,997**	**494,237,782**
මෙහෙයුම් වියදම්				
පුද්ගල පඩිනඩි	12	335,858,150	314,556,362	314,556,362
ගමන් වියදම්	13	1,763,084	1,145,084	1,145,084
සැපයුම් සහ පරිභෝජන වියදම්	14	11,146,484	6,441,602	6,441,602
නඩත්තු වියදම්	15	8,800,591	9,154,615	9,154,615
ගිවිසුම්ගත සේවාවන්	16	84,614,603	61,409,962	61,409,962
පුහුණු වියදම්	17	27,229,427	10,190,629	8,676,693
වාර්ෂික ක්ෂය	01.b	89,368,197	89,109,596	89,109,596
ක්‍රමක්ෂය ගැලපීම්	01.02	2,394,908	423,400	423,400
වෙනත් වියදම්	18	8,463,224	5,239,525	5,239,525
සංචිත සඳහා මුදල් මාරුකිරීම	7.2	668,419		5,800,000
මුළු වියදම		**570,307,086**	**497,670,775**	**501,956,839**
ශුද්ධ අතිරික්ත/ ඌණතාවය		(44,713,970)	(573,778)	(7,719,057)
ස්ථාවර තැන්පතු සඳහා ලද පොළී අදායම් සංචිත සඳහා මාරු කිරීම		(633,619)		(274,234)
ස්ථාවර තැන්පතු සඳහා ලද පොළී අදායම සංචිත සඳහා මාරු කිරීමෙන් පසු ශුද්ධ අතිරික්තය/ ඌණතාවය		**(45,347,589)**		**(7,993,291)**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

2022 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය.

	බැඳුම්කර - අවලංගුවීමෙන් ලද සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රජයේ දායකත්වය	වෙනත් ප්‍රදාන	ආංශික සංවර්ධන වැඩසටහන - ප්‍රදාන	ප්‍රාග්ධන සංචිත	AHEAD ප්‍රදාන	සමුච්චිත අතිරික්තය (ඌණතාවය)	එකතුව
01/01/2021 දිනට ශේෂය			**796,159,879**	**6,584,250**	**300,060,865**	**5,584,121**		**(518,985,846)**	**589,403,269**
වර්ෂයේ ලාභය								(1,919,057)	(1,919,057)
වෙනත් ප්‍රදාන සඳහා නැවත සකසන ලද ශේෂය			2,884,115						
පෙර වර්ෂය සඳහා ගැළපීම්			**7,113,931**					(2,704,449)	4,409,482
ප්‍රාග්ධන හා සංචිත						6,074,234		(6,074,234)	
වර්ෂය තුල ප්‍රාග්ධන ප්‍රදාන			53,582,468	15,300,000	(2,229,266)		1,628,640		68,281,842
විලම්බිත ආදායම			(68,830,470)	(7,650,000)	(16,877,526)				(93,357,996)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය			**790,909,923**	**14,234,250**	**280,954,073**	**11,658,355**	**1,628,640**	**(529,683,586)**	**569,701,655**
වර්ෂයේ ලාභය								(45,347,589)	(45,347,589)
පෙර වර්ෂය සඳහා ගැළපීම්								1,375,497	1,375,497
ස්ථාවර තැන්පතු සඳහා ලද පොළිය						633,620			633,620
අරමුදල් මාරු කිරීම						668,419			668,419
වර්ෂය තුල ප්‍රාග්ධන ප්‍රදාන	1,732,125	1,673,211,343	60,175,827		201,516		3,448,224		1,738,769,035
විලම්බිත අදායම			(51,741,343)	(3,825,000)	(36,196,762)				(91,763,105)
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,732,125**	**1,673,211,343**	**799,344,406**	**10,409,250**	**244,958,827**	**12,960,394**	**5,076,864**	**(573,655,678)**	**2,174,037,532**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය		
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)		
	31/12/2022	**31/12/2021**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ඇතිවූ මුදල් ප්‍රවාහය		
බදු පෙර ශුද්ධ ලාභය/ (අලාභය)	(45,347,589)	(573,779)
මූල්‍ය නොවන විචල්‍යයන් ගේ ගැළපීම		
එකතුකළා		
පාරිතෝෂික සඳහා වෙන්කිරීම	10,521,420	11,475,194
ක්ෂය සහ ක්‍රමක්ෂය	91,763,105	89,532,996
මුදල් නොවන ක්‍රියාකාරකම්		4,409,482
වෙනත් ප්‍රදාන	201,518	15,300,000
පෙර වර්ෂයේ ගැළපීම්	1,375,497	
අඩුකිරීම		
දේපළ පිරියත උපකරණ ගැළපීම්	(948,351)	
ප්‍රත්‍යාගණන අතිරික්තය	(1,673,211,343)	
ක්ෂය සහ ක්‍රමක්ෂය	(91,763,105)	(89,532,996)
ස්ථාවර තැන්පතු පොළිය		(390,660)
කාරක ප්‍රාග්ධනය ගැළපීමට පෙර මෙහෙයුම් ලාභය	**(1,707,408,848)**	**30,220,237**
කාර්ය මණ්ඩල ණය අඩුවීම/ (වැඩිවීම)	(562,022.36)	2,568,193
ඉන්වෙන්ට්‍රි (තොග) වල අඩුවීම/ (වැඩිවීම)	(1,534,928.00)	1,177,051
වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම/ (වැඩිවීම)	11,884,831.97	26,813,068
වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු මුදල් වැඩිවීම/ (අඩුවීම)	(15,806,994.81)	(51,184,115)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද මුදල්	**(1,713,427,961)**	**9,594,434**
පාරිතෝෂික ගෙවීම්	(2,557,148.00)	(2,386,430)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(1,715,985,109)**	**7,208,004**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම		
ස්ථාවර තැන්පතු පොළිය ලැබීම	633,619.00	241,920
දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	(37,593,758.19)	(38,540,722)
ස්ථාවර තැන්පතු මත ආයෝජනය	(633,619.00)	(6,592,379)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(37,593,758)**	**(44,891,181)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම		
ස්ථාවර තැන්පතු පොළිය ලැබීම		6,074,234
ප්‍රාග්ධන ප්‍රදාන	60,175,826.81	53,582,468
ප්‍රාග්ධන ප්‍රදාන - ආංශික සංවර්ධන වැඩසටහන (SSDP)		(2,229,266)
බැඳුම්කර අවලංගුවීමෙන් ලද සංචිත	1,732,125	
AHEAD ව්‍යාපෘතිය මඟින් ප්‍රදාන	3,448,224	1,628,640
පරිපාලන අරමුදල්	668,418	(6,074,234)
ප්‍රත්‍යාගණන සංචිතය	1,673,211,342.81	
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**1,739,235,936**	**52,981,842**
ශුද්ධ වැඩිවීම /(අඩුවීම) මුදල් සහ මුදල් සමාන දෑ	(14,342,931.37)	15,298,665
කාලපරිච්ඡේදයේ ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	30,877,800.00	15,579,135
කාලසීමාව අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**16,534,868.63**	**30,877,800**

සටහන 01. ඒ		2022.12.31 දිනට දේපළ පිරියත හා උපකරණ ශේෂය			
	භාණ්ඩාගර කේත	වත්කම් වර්ගය	2022.01.01 දිනට පිරිවැය	වර්ෂය තුළ මිල දී ගැනීම් / මාරු කිරීම්	2022.12.31 දිනට ශේෂය
1	2105	ඉඩම්	1,189,059,500.00		1,189,059,500.00
2	2001/01	ගොඩනැඟිලි සහ වැඩිදියුණු කිරීම්	794,243,520.00	7,439,030.24	801,682,550.24
3	2103/03	පරිගණක උපකරණ	35,026,500.00		35,026,500.00
4	2103/06	විදුලි උපකරණ	9,859,300.00	2,806,450	12,665,750.00
5	2103/08	ගිනි නිවීමේ උපකරණ	887,200.00		887,200.00
6	2102	ගෘහ භාණ්ඩ සහ උපාංග	58,753,000.00	6,086,217	64,839,216.50
7	2103/07	කාය වර්ධන (GYM) උපකරණ	1,888,700.00		1,888,700.00
8	2107/04	විද්‍යාගාර උපකරණ	6,422,400.00	2,936,947	9,359,347.25
9	2103/09	උපකරණ - නඩත්තු	49,600.00		49,600.00
10	2003	මෝටර් වාහන	75,310,000.00	2,484,677	77,794,677.26
11	2004	කාර්යාල උපකරණ	13,581,500.00		13,581,500.00
12	2107	පුහුණු උපකරණ	4,302,180.00	1,258,009	5,560,188.61
13	2005/02	යාත්‍රා	36,448,000.00		36,448,000.00
14	2103	වැඩමුළු උපකරණ	19,569,800.00	4,822,234	24,392,033.54
15	2106/05	උපාධි ලෝගු	1,079,250.00	250,000	1,329,250.00
16	2107/03	පුස්තකාල පොත්	29,835,604.00	1,504,679	31,340,283.00
17	2106	වෙනත් වත්කම්	2,158,531.00	(525,947)	1,632,584.00
		මුළු වත්කම	**2,278,474,585**	**29,062,295**	**2,307,536,880.40**

සටහන 01.බී

2022.12.31 දිනට සම්මුචිත ක්ෂය දේපළ පිරියත හා උපකරණ					
	භාණ්ඩාගර කේත	වත්කම් වර්ගය	2022.01.01දිනට පිරිවැය	වාර්ෂික ක්ෂය	2022.12.31 දිනට ශේෂය
1	2105	ඉඩම්			-
2	2001/01	ගොඩනැඟිලි සහ වැඩිදියුණු කිරීම්		39,912,821.14	39,912,821.14
3	2103/03	පරිගණක උපකරණ		11,558,745	11,558,745.00
4	2103/06	විදුලි උපකරණ		985,930	985,930.00
5	2103/08	ගිනි නිවීමේ උපකරණ		88,720	88,720.00
6	2102	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්		5,941,867	5,941,867.00
7	2103/07	කාය වර්ධන (GYM) උපකරණ		188,870	188,870.00
8	2107/04	විද්‍යාගාර උපකරණ		642,240	642,240.00
9	2103/09	උපකරණ - නඩත්තු		4,960	4,960.00
10	2003	මෝටර් වාහන		19,010,553	19,010,553.00
11	2004	කාර්යාල උපකරණ		1,358,150	1,358,150.00
12	2107	පුහුණු උපකරණ		493,521	493,521.00
13	2005/02	යාත්‍රා		3,644,800	3,644,800.00
14	2103	වැඩහල් උපකරණ		2,012,904	2,012,904.00
15	2106/05/01	උපාධි ලෝගු	754,800.00	290,646	1,045,446.00
16	2107/03/01	පුස්තකාල පොත්	19,473,167.00	3,070,212	22,543,378.90
17	2106/00/01	වෙනත් වත්කම්	667,969.00	163,258	831,227.40
		මුළු ක්ෂය	**20,895,936**	**89,368,197**	**110,264,133**

සටහන 01.

ඉදිරියට ගෙන ආ දේපළ පිරියත හා උපකරණ ශේෂය			
	භාණ්ඩාගර කේත	වත්කම් වර්ගය	**2022.12.31** දිනට ශේෂය
1	2105	ඉඩම්	1,189,059,500
2	2001/01	ගොඩනැඟිලි සහ වැඩිදියුණු කිරීම්	761,769,729
3	2103/03	පරිගණක උපකරණ	23,467,755
4	2103/06	විදුලි උපකරණ	11,679,820
5	2103/08	ගිනි නිවීමේ උපකරණ	798,480
6	2102	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	58,897,350
7	2103/07	කාය වර්ධන (GYM) උපකරණ	1,699,830
8	2107/04	විද්‍යාගර උපකරණ	8,717,107
9	2103/09	උපකරණ - නඩත්තු	44,640
10	2003	මෝටර් වාහන	58,784,124
11	2004	කාර්යාල උපකරණ	12,223,350
12	2107	පුහුණු උපකරණ	5,066,668
13	2005/02	යාත්‍රා	32,803,200
14	2103	වැඩහල් උපකරණ	22,379,130
15	2106/05	උපාධි ලෝගු	283,804
16	2107/03	පුස්තකාල පොත්	8,796,904
17	2106	වෙනත් වත්කම්	801,357
		මුළු ශේෂය	**2,197,272,747**

සටහන 01.1 නොනිමි වැඩ - ගොඩනැගිලි

	භාණ්ඩාගර කේත	වත්කම් වර්ගය	**2022.01.01** දිනට පිරිවැය **(A)**	වර්ෂය තුල මිලදී ගැනීම් / මාරු කිරීම්	ප්‍රත්‍යාගණය / මාරුකිරීම්	**2022.12.31** දිනට ශේෂය
1	2104/09	JAICA ගොඩනැගිලි වැඩහල - තංගල්ල	1,792,674.82		(1,792,674.82)	-
2	2104/10	ශිෂ්‍ය නේවාසිකාගාරය - තංගල්ල	1,021,247.80	181,400.96	(1,202,648.76)	
3	2104/11	බූස්ස ගොඩනැඟිල්ල - අදියර 02	10,508,328.98	3,116,699		13,625,027.76
4	2104/12	බූස්ස ගොඩනැඟිල්ල - අදියර 03	15,270,808.02	14,643,357		29,914,164.92
5	2104/13	බූස්ස ආරක්ෂක කුටිය	3,970,489.80	612,865		4,583,355.09
6	2104/14	බූස්ස වෙල්ඩින් වැඩහල	5,598,747.46	830,832		6,429,579.86
7	2104/15	කොයිකා ව්‍යාපෘතිය		2,538,326.00		2,538,326.00
8	2104/16	සහකාර අධ්‍යක්ෂ නිළ නිවාසය - තංගල්ල		1,020,151		1,020,150.56
9	2104/17	නව ගොඩනැගිල්ල - මීගමුව		3,745,195		3,745,194.95
		මුළු ශේෂය	**38,162,297**	**26,688,826**	**(2,995,323.58)**	**61,855,799**

සටහන **01.2** අස්පෘශ්‍ය වත්කම්						
	භාණ්ඩාගර කේත	වත්කම් වර්ගය	**2022.01.01** දිනට පිරිවැය	වර්ෂය තුල මිලදී ගැනීම් / මාරු කිරීම්	ප්‍රත්‍යාගණය / මාරුකිරීම්	**2022.12.31** දිනට ශේෂය
1	2103/04	අස්පෘශ්‍ය වත්කම්	4,877,140.00	5,494,487		10,371,627.00
		මුළු ශේෂය	**4,877,140.00**	**5,494,487**	**-**	**10,371,627.00**

අස්පෘශ්‍ය වත්කම් හි සමුච්චිත ක්‍රමක්ෂය					
	භාණ්ඩාගර කේත	වත්කම් වර්ගය	**2022.01.01** දිනට පිරිවැය	වාර්ෂික ක්ෂය	**2022.12.31** දිනට ශේෂය
1	2103/04/01	අස්පෘශ්‍ය වත්කම්	515,740.00	2,394,908	2,910,648.00
		මුළු ශේෂය	**515,740.00**	**2,394,908**	**2,910,648.00**

ඉදිරියට ගෙන ආ අස්පෘශ්‍ය වත්කම් ශේෂය			
	භාණ්ඩාගර කේත	වත්කම් වර්ගය	**2022.12.31** දිනට ශේෂය
1	2103/04	අස්පෘශ්‍ය වත්කම්	7,460,979.00
		මුළු ශේෂය	**7,460,979.00**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

සටහන **1.3** **2021.12.31** දිනට ප්‍රත්‍යාගණන සැසඳුම් ප්‍රකාශය.

	භාණ්ඩාගර කේතය	වත්කම් වර්ගය	**2021 .12.31** දිනට පිරිවැය **(A)**	**2021.12.31** දිනට සමුච්චිත ක්ෂය **(B)**	**2021.12.31** දිනට ශුද්ධ පොත් වටිනාකම **(C) = (A)-(B)**	**2021.12.31** දිනට ප්‍රත්‍යාගණන ශේෂය **(D)**	ප්‍රත්‍යාගණන (අතිරික්තය)/ඌණතාවය **(E)= (C)- (D)**	ප්‍රත්‍යාගණනයෙන් පසු ශුද්ධ පොත් වටිනාකම
1	2105	ඉඩම් සහ වැඩිදියුණු කිරීම්	8,318,862	5,693,716	2,625,146	1,189,059,500.00	(1,186,434,354)	1,189,059,500.00
2	2001/01	ගොඩනැගිලි සහ වැඩිදියුණු කිරීම්	606,577,697	179,763,812	426,813,885	794,243,520.00	(367,429,635)	794,243,520.00
3	2103/03	පරිගණක උපකරණ	48,516,546	48,025,199	491,391	35,026,500	(34,535,109.00)	35,026,500
4	2103/06	විදුලි උපකරණ				9,859,300	(9,859,300.00)	9,859,300
5	2103/08	ගිනි නිවීමේ උපකරණ				887,200	(887,200.00)	887,200
6	2102	ගෘහ භාණ්ඩ සහ උපාංග	111,305,388	64,236,838	47,068,550	58,753,000	(11,684,450.00)	58,753,000
7	2103/07	කායවර්ධන (GYM) උපකරණ			-	1,888,700	(1,888,700.00)	1,888,700
8	2107/04	විද්‍යාගාර උපකරණ	9,728,428	9,728,428	-	6,422,400	(6,422,400.00)	6,422,400
9	2103/09	උපකරණ - නඩත්තු			-	49,600	(49,600.00)	49,600
10	2003	රථ වාහන	83,173,314	74,812,149	8,361,165	75,310,000	(66,948,835.00)	75,310,000
11	2004	කාර්යාල උපකරණ	3,111,388	1,840,689	1,270,699	13,581,500	(12,310,801.00)	13,581,500
12	2107	පුහුණු උපකරණ	124,327,547	85,293,746	39,033,801	4,302,180	34,731,621.00	4,302,180
13	2005/02	යාත්‍රා	14,000,253	13,304,327	695,926	36,448,000	(35,752,074.00)	36,448,000
14	2103	වැඩහල් උපකරණ	151,377,831	104,406,607	46,971,224	19,569,800	27,401,424.00	19,569,800
15	2106	වෙනත් වත්කම් (මෘදුකාංග සංවර්ධන සහ විශ්වවිද්‍යාල ලෝගු)	2,158,531	667,969	1,490,562	N/A	N/A	1,490,562
16	2106/05	උපාධි ලෝගු	1,079,250	754,800	324,450	N/A	N/A	324,450
17	2103/04	අස්පෘශ්‍ය වත්කම්	4,877,140	515,740	4,361,400	N/A	N/A	4,361,400
18	2107/03	පුස්තකාල පොත්	29,835,604	19,473,167	10,362,437	N/A	N/A	10,362,437
		මුළු එකතුව	**1,198,387,779**	**608,517,187**	**589,870,636**	**2,245,401,200**	**(1,672,069,413)**	**2,261,940,049**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

ගිණුම් සටහන් - 2022 දෙසැම්බර් 31 දිනට

		2022 දෙසැම්බර් 31 දිනට ශේෂය	2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	2021 දෙසැම්බර් මස 31 දිනට නැවත සකස්කරන ලද ශේෂය
සටහන් අංක (2)		**(රු.)**	**(රු.)**	**(රු.)**
කාර්ය මණ්ඩල ණය				
ආපදා ණය		12,929,097	12,375,863	12,375,863
උත්සව අත්තිකාරම්		125,750	93,250	93,250
පොත් ණය		750	750	750
සුනාමි ණය		133,586	157,297	157,297
		13,189,183	**12,627,160**	**12,627,160**
සටහන් අංක (3)				
31/12/2022 දිනට තොගය				
ලිපි ද්‍රව්‍ය		1,918,570	570,731	570,731
		1,918,570	**570,731**	**570,731**
සටහන් අංක (3.1)				
31/12/2022 දිනට තොගය - තීන්ත සහ උපකරණ		187,089		
		187,089		
සටහන් අංක (4)				
ලැබිය යුතු ශේෂ				
ලැබිය යුතු තැන්පතු (විදුලිබල - නාරා)		218,750	218,750	218,750
ලැබිය යුතු තැන්පතු (වාහන කුලී)		50,000	47,000	47,000
අත්තිකාරම්		3,897,167	3,742,167	3,742,167
නේවාසිකාගාර සඳහා තැන්පතු		1,650,000	1,673,500	1,673,500
ලැබිය යුතු පාඨමාලා ගාස්තු - උසස් අධ්‍යයන අංශය		7,699,705	9,391,623	9,391,623
ලැබිය යුතු නේවාසික ගාස්තු - උසස් අධ්‍යයන අංශය		-	110,000	110,000
සිලෝන් ඔක්සිජන්		48,000	18,635	18,635
නාරා - තැන්පතු		285,000	180,000	180,000
ලැබිය යුතු - තැන්පතු		-	124,920	124,920
ගොඩනැගිලි සඳහා වූ ලැබිය යුතු තැන්පතු		-	1,822,500	1,822,500
සුභසාධනය - නිෆ්නි		-	-	-
ලැබිය යුතු ප්‍රදාන - ආංශික සංවර්ධන අරමුදල		544,653	544,653	544,653
අත්තිකාරම් ගෙවීම් - බුස්ස 2 වන අදියර		313,801	1,311,566	1,311,566
අත්තිකාරම් ගෙවීම් - බුස්ස 3 වන අදියර		7,217,452	13,942,531	13,942,531
අත්තිකාරම් ගෙවීම් - ගජ්මා		-	685,200	685,200
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය		227,425	148,740	148,740
වෙනත් ලැබිය යුතු දෑ		25,000	300,000	300,000
ඉන්ධන අත්තිකාරම් - ඔරියන්ටල් ඉන්ධන හල - මට්ටක්කුලිය.		200,000		
		22,376,953	**34,261,785**	**34,261,785**

සටහන් අංක (5)				
මුදල් සහ මුදල් සමාන දෑ (බැංකු)				
බැංකු මුදල් - මහජන බැංකුව - 9868		5,392,725	7,739,603	7,739,603
බැංකු මුදල් - මහජන බැංකුව - 9909		2,045,962	14,455,726	14,455,726
බැංකු මුදල් - මහජන බැංකුව - 9910		9,096,181	7,053,832	7,053,832
බැංකු මුදල් - මහජන බැංකුව - 9911		-	1,628,640	1,628,640
		16,534,868	**30,877,801**	**30,877,801**
සටහන් අංක (6)				
ප්‍රාග්ධන සහ සංචිත				
ස්ථාවර තැන්පතු - පුස්තකාල හා විද්‍යාගාර තැන්පතු		1,245,331	1,180,408	1,180,408
විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල		5,924,374	5,238,975	5,238,975
උපකුලපති අරමුදල		2,379,039	2,129,656	2,129,656
විශ්වවිද්‍යාල පරිපාලන සංවර්ධන අරමුදල		3,411,649	3,109,316	3,109,316
		12,960,393	**11,658,355**	**11,658,355**
සටහන් අංක (7)				
සමුච්චිත අරමුදල				
2022 .01.01 දිනට ආරම්භක ශේෂය		805,144,165	796,159,880	796,159,880
එකතු කළා - භාණ්ඩාගාර ප්‍රදාන		60,175,827	53,582,468	56,466,583
පූර්ව වර්ෂයේ ගැළපීම			7,113,931	7,113,931
ප්‍රදාන වලින් ප්‍රකාශිත ක්‍රමක්ෂය මුදල		(55,566,343)	(68,830,470)	(68,830,470)
2022.12.31 දිනට ශේෂය		**809,753,648**	**788,025,809**	**790,909,924**
සටහන 07.01				
		වෙනත් අරමුදල් (A)	**සම්මුචිත අරමුදල (B)**	**එකතුව E = (A) + (B)=©**
2022.01.01 ආරම්භක ශේෂය		14,234,250.00	790,909,915.00	805,144,165.00
වර්ෂය තුළ ලැබීම්			60,175,826.81	60,175,826.81
එකතුව		14,234,250.00	851,085,741.81	865,319,991.81
ක්‍රමක්ෂය ගැළපීම		(3,825,000.00)	(51,741,343.44)	(55,566,343.44)
2022.12.31 දිනට ශේෂය		**10,409,250.00**	**799,344,398.37**	**809,753,648.37**
AHEAD ව්‍යාපෘතිය සඳහා ප්‍රදාන (A)				
2022.01.01 ආරම්භක ශේෂය		1,628,640.00		
වර්ෂය තුළ ලැබීම්		3,448,224.00		
එකතුව		5,076,864.00		
2022.12.31 දිනට ශේෂය		**5,076,864.00**		
සටහන් අංක (8)				
සමුච්චිත අරමුදල - ආංශික සංවර්ධන වැඩසටහන (SSDP)				
2022.01.01 දිනට ආරම්භක ශේෂය		280,954,073	300,060,865	

ආංශික සංවර්ධන වැඩසටහන - සමුච්චිත අරමුදල, වාර්ෂික ලැබීම් සඳහා ප්‍රදාන		201,518	(2,229,266)	
ප්‍රදාන වලින් ප්‍රකාශිත ක්‍රමක්ෂය ගැළපීම		(36,196,762)	(16,877,526)	
2022.12.31 දිනට ශේෂය		**244,958,829**	**280,954,073**	
සටහන් අංක (9)				
සමුච්චිත අතිරික්තය/ (ඌණතාවය)				
2022.01.01 ආරම්භක ශේෂය (ඌණතාවය)		(529,683,585.90)	(518,985,846)	(518,985,846)
එකතු කළා : වසර තුළ අතිරික්තය/ (ඌණතාවය)		(45,347,589)	(573,779)	(7,993,291)
පෙර වර්ෂයේ ගැළපීම්		1,375,497.17	(2,704,449)	(2,704,449)
ප්‍රාග්ධන සංචිත සඳහා මාරුකිරීම			(6,074,234)	
2022.12.31 දිනට ශේෂය		**(573,655,678)**	**(528,338,308)**	**(529,683,586)**
සටහන් අංක (10)				
ගෙවිය යුතු දේ				
රඳවා ගැනීම්		7,569,134	12,231,291	12,231,291
නැවත ගෙවිය යුතු - ටෙන්ඩර් තැන්පතු		-	107,200	107,200
නැවත ගෙවිය යුතු - පුස්තකාල තැන්පතු		2,681,000	2,484,000	2,484,000
නැවත ගෙවිය යුතු - විද්‍යාගාර තැන්පතු		1,707,000	1,607,000	1,607,000
මුද්දර ගාස්තු		199,361	121,986	121,986
උපයන විට ගෙවීම්		81,013	80,061	80,061
නැවත ගෙවිය යුත තැන්පතු		182,080	-	-
නැවත ගෙවිය යුතු - නේවාසිකාගාර තැන්පතු		-	653,526	653,526
විගණන ගාස්තු		1,020,000	796,000	796,000
ණය හිමියන්ට ගෙවීම්		840,688	851,206	851,206
පානදුර ගොඩනැගිල්ල		-	1,343,450	1,343,450
මට්ටක්කුලිය වැඩහල		-	266,354	266,354
පර්යේෂණ වියදම්		154,601	-	-
නැවත ගෙවිය යුතු තැන්පතු		285,826	-	-
ගෙවිය යුතු පර්යේෂණ වියදම්		360	24,900	-
		14,721,063	**20,566,974**	**20,542,074**
සටහන් අංක (11)				
වෙනත් ආදායම්				
ආපදා ණය පොළිය		482,917	465,862	465,862
විවිධ ආදායම්		7,886,498	804,375	804,375
භාණ්ඩ වෙන්දේසියෙන් ලද ආදායම		157,977	437,700	437,700
<u>පාඨමාලා ගාස්තු ආදායම්</u>				-
උසස් අධ්‍යයන අංශය		2,016,304	13,753,381	13,753,381
වෘත්තීය තාක්ෂණ අංශය		6,648,565	2,521,250	2,521,250
නේවාසිකාගාර හා නිළ නිවාස ආදායම්		238,558	173,179	173,179

පාඨමාලා ගාස්තු - ධීවර යාත්‍රා නියමු පුහුණු පාඨමාලා		2,342,000	1,072,250	1,072,250
ජංගම පුහුණු පාඨාමාලා		1,464,346	2,518,302	2,518,302
ටෙන්ඩර් ආදායම්		193,000	218,000	218,000
Symposium - සම්මන්ත්‍රණය සඳහා ලැබීම්		-	467,314	467,314
අභියෝග්‍යතා පරීක්ෂණ ආදායම		4,432,200	5,301,000	5,301,000
ස්ථාවර තැන්පතු පොළී		702,681	390,660	390,660
සංචාරක බංගලා ආදායම		208,050	36,400	36,400
Convocation - උපාධි ප්‍රදාන උත්සවය සඳහා ලැබීම්		1,053,000	-	-
විභාග සඳහා නැවත ඉදිරිපත්වීමේ ගාස්තු		14,000	-	-
පිටපත් ගාස්තු		1,575	-	-
ප්‍රතිඵල නැවත අධීක්ෂණය කිරීමේ ගාස්තු		5,000	-	-
ලියාපදිංචි ගාස්තු - උසස් අධ්‍යයන අංශය		375,000	-	-
ලියාපදිංචි ගාස්තු - ප්‍රාදේශීය මධ්‍යස්ථාන		28,250	-	-
අයදුම්පත් ගාස්තු		361,600	-	-
රක්ෂණ හිමිකම්		200,000	-	-
පශ්චාත් උපාධි පාඨමාලා පැවැත්වීමෙන් ලද ආදායම්		192,000	-	-
පොත් ණය පොලී		3,289	-	-
නේවාසිකාගාර ගාස්තු		243,200	-	-
පර්යේෂණ අධ්‍යයන ආපසු ගෙවීම්		-	-	24,900
		29,250,010	**28,159,493**	**28,184,393**
සටහන් අංක (12)				
පුද්ගල නඩත්තු වියදම්				
වැටුප් හා වේතන		137,666,966	128,804,908	128,804,908
සේවක භාර අරමුදල		25,832,651	25,320,171	25,320,171
සේවක අර්ථ සාධක අරමුදල්		6,455,038	6,347,933	6,347,933
වෙනත් දීමනා		117,274,833	116,456,157	116,456,157
පර්යේෂණ දීමනා		13,145,447	6,634,247	6,634,247
අතිකාල දීමනා		6,642,909	5,779,633	5,779,633
පාරිතෝෂික වෙන්කිරීම්		10,521,420	11,475,194	11,475,194
බාහිර කථිකාචාර්ය ගාස්තු		17,768,886	13,741,120	13,741,120
පර්යේෂණ වියදම්		550,000		
		335,858,150	**314,559,363**	**314,559,363**
සටහන් අංක (13)				
ගමන් වියදම්				
දේශීය ගමන් වියදම්		1,763,084	1,145,084	1,145,084
විදේශ ගමන් වියදම්		-	-	-
		1,763,084	**1,145,084**	**1,145,084**
සටහන් අංක (14)				
සැපයුම් සහ පරිභෝජන				
ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය උපකරණ		2,641,727	2,361,155	2,361,155
වාහන සඳහා ඉන්ධන සහ ලිහිසි තෙල්		7,921,954	3,511,629	3,511,629
පිරිසිදු කිරීම සහ වෙනත් ද්‍රව්‍ය		53,735	54,454	54,454

වෛද්‍යාධාර		528,888	510,754	510,754
වෙනත් සැපයුම්		180	3,612	3,612
		11,146,484	**6,441,602**	**6,441,602**
සටහන් අංක (14.1)				
ලිපි ද්‍රව්‍ය සහ කාර්යාලීය උපකරණ				
ආරම්භක තොගය - 2022.01.01		570,731	1,747,782	1,747,782
එකතුකළා - වාර්ෂික මිලදී ගැනීම්		3,989,567	1,184,104	1,184,104
අඩුකළා - අවසාන ශේෂය - 2022.12.31		(1,918,570)	(570,731)	(570,731)
වාර්ෂික පරිභෝජනය		**2,641,727**	**2,361,155**	**2,361,155**
සටහන් අංක (15)				
නඩත්තු වියදම්				
වාහන		3,890,754	4,111,192	
ගොඩනැගිලි සහ ඉදිකිරීම්		1,345,370	1,187,602	1,187,602
යන්ත්‍ර සූත්‍ර		2,586,142	1,606,038	1,606,038
යාත්‍රා		323,469	495,589	495,589
කාර්යාල උපකරණ		654,856	774,675	774,675
වාහන අළුත්වැඩියා කටයුතු		-	979,519	979,519
		8,800,591	**9,154,615**	**9,154,615**
සටහන් අංක (16)				
ගිවිසුම්ගත සේවාවන්				
දුරකථන වියදම්		6,666,973	7,444,591	7,444,591
තැපැල් වියදම්		363,177	184,640	184,640
ප්‍රවාහන වියදම්		4,147,913	1,282,918	1,282,918
විදුලි ගාස්තු		8,014,181	4,373,908	4,373,908
ජල ගාස්තු		1,723,597	1,517,238	1,517,238
කුළී ගාස්තු හා බදු		33,569,152	26,754,687	26,754,687
ආරක්ෂක වියදම්		15,249,083	10,860,465	10,860,465
පවිත්‍රතා කටයුතු සඳහා වියදම්		9,834,539	8,307,499	8,307,499
විගණන ගාස්තු		1,405,000	659,858	659,858
වෙනත් වියදම්		100,361	24,339	24,339
එෆ්.ඒ.ආර්.(FAR-ස්ථාවර වත්කම් ලේඛනය සැකසීමේ වියදම්)		3,540,626	-	-
		84,614,603	**61,409,962**	**61,410,143**
සටහන් අංක (17)				
පුහුණු වියදම්				
පුහුණු ද්‍රව්‍ය		10,023	-	-
වෘත්තීය තාක්ෂණ අංශය සඳහා වූ වියදම්		6,787,747	2,554,068	2,554,068
උසස් අධ්‍යයන අංශය සඳහා වූ වියදම්		10,399,084	3,054,514	3,054,514
ධීවර යාත්‍රා නියමු - පුහුණු කිරීමේ වියදම්		872,260	869,445	869,445
ජංගම පුහුණු පාඨමාලා වියදම්		169,050	299,378	299,378
අභියෝග්‍යතා පරීක්ෂණ වියදම්		1,487,259	1,508,628	1,508,628
යටිතල පහසුකම් - වියදම්		-	1,513,936	-
ධාරිතා සංවර්ධන වියදම - රජයේ ප්‍රදාන		771,101	390,660	390,660
උපාධි ප්‍රදානෝත්සවයේ වියදම්		6,428,070	-	-
සම්මන්ත්‍රණ වියදම්		304,832	-	-
		27,229,427	**10,190,629**	**8,676,693**

සටහන් අංක (18)				
වෙනත් වියදම්				
සුභසාධනය		837,066	421,766	421,766
විනෝදාස්වාදය (Entertainment)		1,583,541	938,385	938,385
පාලන මණ්ඩල රැස්වීම් වියදම්		517,557	1,398,090	1,398,090
බැංකු ගාස්තු		8,350	7,980	7,980
උපදේශන ගාස්තු		449,316	420,650	420,650
නීති ගාස්තු සහ වෙනත් දීමනා		566,843	89,430	89,430
ආහාර හා නිළ ඇඳුම්		-	-	-
සාමාජිකත්වය ලබාගැනීමේ වියදම්		315,479	-	-
නාරා - ප්‍රවාහනය		769,725	422,034	422,034
මාධ්‍ය වියදම්		3,189,847	1,499,646	1,499,646
සම්මන්ත්‍රණය		-	41,544	41,544
විවිධ ලැබිය යුතු දෑ ලියා හැරීම්		225,500	-	-
		8,463,224	**5,239,525**	**5,239,525**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. VOT/E/OUSL/2022/FA/07

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2023 ජූලි 20 දින

උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ. මොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-

1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
+94 11 2 88 70 28 - 34
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
+94 11 2 88 72 23
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. VOT/E/OUSL/2022/FA/07 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2023 ජූලි 20 දින

උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය

ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කල මතය

ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 53 වගන්තිය ප්‍රකාරව ප්‍රත්‍යාගණනයක ප්‍රතිඵලයක් වශයෙන් වත්කම් පන්තියක ධාරණ අගය අඩුවීමක් සිදුවන විටක එම අඩුවීම අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනාගත යුතු වුවද රු.62,133,045 ක් වූ ප්‍රත්‍යාගණන අලාභය ප්‍රත්‍යාගණන ලාභයෙන් අඩුකර දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා ප්‍රත්‍යාගණන සංචිතය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව ආයතනයට ලැබී තිබූ රු.63,825,567 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් සිදු කර නොතිබුණි.

(ඇ) 2020 වර්ෂයේ අවසානයට පැවති රු.6,155,458 ක් වූ උපචිත වියදම් නිරවුල් කිරීමට අදාල කොරතුරු එම වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) 2021 වර්ෂය තුළ සේවය අවසන් කල නිලධාරියෙකුට සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික ගෙවීමේදී පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුමට ගැලපීමකින් තොරව වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් රු.563,582 කින් පාරිතෝෂික වෙන් කිරීමේ ගිණුම හා වර්ෂයේ ඌනතාවය පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව කොන්ත්‍රාත් ඇදවුම් මුදල් ශේෂය රු.7,569,134 ක් වුවද අදාල උපලේඛන අනුව එම ශේෂය රු.14,598,570 ක් වූයෙන් රු.7,029,436 ක වෙනසක් පැවතුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්ව විද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්ව විද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්ව විද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්ව විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්ව විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, වේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්ව විද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්ව විද්‍යාලය මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2(ඇ) හි දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්ව විද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට විශ්වවිද්‍යාලයේ හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහයේ 502 (2) වගන්තිය	විශ්වවිද්‍යාලය විසින් රු.3,540,626ක් පෞද්ගලික විගණන ආයතනයකට ගෙවා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සහ 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් ලේඛනයක් පිළියෙල කිරීම සිදුකර නිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි.
(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	2017 හා 2020 වර්ෂයේ සිට අලුත්වැඩියා කල යුතු ව තිබූ වාහන 02ක් ප්‍රමාදයකින් තොරව අලුත්වැඩියා කිරීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබීම හේතුවෙන් එම වාහන දිරාපත් වෙමින් පැවතුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්ව විද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත නිරීක්ෂණයන් හැර විශ්ව විද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 22,149,528 ක් වූ වෙළඳ හා අනිකුත් ලැබිය යුතු දෑ තුල වසර 05 ඉක්මවා නිබුණු අයිතම 06 කට අදාලව එකතුව රු.11,907,417 ක් වූ ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීත් අපොහොසත් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු. 28,118,983 ක් වූ ගෙවිය යුතු ශේෂය තුල වසර 03 කට වැඩි එකතුව රු. 6,147,363 ක් හා වසර 1 ත් 3 ත් අතර එකතුව රු. 21,971,620 ක් වූ ශේෂ පැවතියද එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඇ) ව්‍යාපෘති වෙනුවෙන් ලැබී තිබූ ප්‍රාග්ධන අරමුදල් වාර්ෂිකව උපයෝජනය නොකිරීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.9,096,181ක ශේෂයක් පැවතුණි.

(ඈ) කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබූ කාර්ය මණ්ඩලයට පටහැනිව තනතුරු 11ක් සඳහා නිලධාරීන් 25 දෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුලදී පමණක් වැටුප් හා දීමනා වෙනුවෙන් රු.31,816,612 ක් ගෙවා තිබුණි.

(ඉ) ප්‍රධාන කාර්යාලයේ හා විද්‍යාලවල උපදේශකවරු 42දෙනෙකුගේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් පවත්වනු ලබන පාඨමාලා ඉණාත්මකව හා ඵලදායීව පවත්වාගෙන යාමට නොහැකි වීම හා සිසුන් පාඨමාලා හැරයාමේ ප්‍රවණතාවය වැඩි වී තිබුණි.

(ඊ) 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාල පනතේ පනතේ 66 වගන්තියෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අදාල කර නොගත යුතු බව දක්වා තිබුණද විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන අංශ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නියම කර ඇති ජාතික විශ්වවිද්‍යාල සඳහා අනුමත තනතුරු හා වැටුප් පරිමාණයන් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවාගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

09. විගණකාධිපති වාර්තාවට කරන ලද පැහැදිලි කිරීම්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
இலங்கை சமுத்திர பல்கலைக்கழகம்
Ocean University of Sri Lanka
Office of the Vice Chancellor
කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15. காக்கைதீவு, மட்டக்குளிய, கொழும்பு 15. Crow Island, Mattakkuliya, Colombo 15.

මගේ අංකය :- OCU/05/01/04. ඔබේ අංකය:- VOT/E/OUSL/2022/FA/07.

දිනය:- 2023 අගෝස්තු 15.

විගණන අධිකාරී,
ජාතික විගණන කාර්යාලය,
රජයේ විගණන අංශය,
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව.
කොළඹ 10.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා වූ පිළිතුරු වාර්තාව.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 53 වගන්තිය ප්‍රකාරව අදාළ ගැලපීම ජ'නල් අංක 15 මඟින් නිවැරදි කර මේ සමඟ ඉදිරිපත් කෙරේ.

(ආ) 2023 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේ දී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 (සංශෝධනය) ප්‍රකාරව හුවමාරු නොවන ගනුදෙනු වලින් වන අයභාරය හඳුනා ගැනීම යටතේ ආයතනයට ලැබෙන ප්‍රදාන (ප්‍රාග්ධන) මූල්‍ය ප්‍රකාශන වල අයභාරය ලෙස හඳුනාගෙන ගිණුම් ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ (මූදල්) වෙත උපදෙස් ලබාදෙන ලදී.

(ඇ) 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය වන තෙක් නිරවුල් නොවූ උපචිත වියදම් 2021 වර්ෂයේ දී නිවැරදි කිරීම සඳහා කටයුතු කළ අතර 2020 වර්ෂයේ දී 2020.12.31 ට උපචිත වියදම් විස්තරය ඉදිරිපත් කිරීමේ දී සිදුව ඇති අත්වැරදීමකින් සිදුවී ඇති බවයි. කෙසේ වෙතත් මේ වන විට උපචිත වියදම් නිවැරදිව ගිණුම් තබමින් පවත්වාගෙන යන අතර 2022.12.31 දින වන විටත් එම ශේෂය සම්පූර්ණයෙන් නිවැරදි කර ඇත. එසේම, උපචිත වියදම් ශේෂය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි.

(ඈ) මෙම විමසුම මඟින් පෙන්වා දී ඇති ගෙවීම් ගිණුම්ගත කිරීමේදී සිදුව ඇති ගිණුම්කරණ දෝෂයක් වන අතර, ඉදිරියේ දී මෙවන් මූලික ගිණුම්කරණ දෝෂ තත්ත්වයක් ඇති නොවන පරිදි කටයුතු කිරීම සඳහා

Vice Chancellor : Tel.: +94 (0)11 7112650 Fax :1+94 (0)11 2529866 Website : http//www.ocu.ac.lk

විෂයභාර නිලධාරීන් සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. 2023 වර්ෂය වෙනුවෙන් නිවැරදිව පාරිතෝෂික සඳහා වෙන්කිරීම් සිදුකර ඇත.

(ඉ) 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව කොන්ත්‍රාත් රැඳවුම් මුදල් ශේෂය වූ 7,569,134/- ට අදාළව උපලේඛනය යාවත්කාලීන කර ඇති අතර පිටපතක් මේ සමග ඉදිරිපත් කර ඇත.

1.3 <u>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.</u>

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2022 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2023.04.24 දින ජාතික විගණන උප කාර්යාලය වෙත යොමු කරන ලද අතර, සම්පූර්ණ වාර්තාව ඉදිරියේදී විගණන උප කාර්යාලය වෙත ලබා දීමට කටයුතු කරමි.

2.වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2.2.2 (අ) මෙම කාරණය ඉටු නොවීම පිළිබඳව ලේඛකාධිකාරිගේ සහ අධ්‍යක්ෂ (මුදල්) ගේ අවධානය යොමුකරවූ අතර, ස්ථාවර වත්කම් ලේඛණය තත්කාලීනව පවත්වාගෙන යන ලෙස උපදෙස් ලබාදෙන ලදී.

2.2.2 (ආ) මෙම වාහන දෙකෙන් කෘ කැබ් රථය අළුත්වැඩියා කිරීම සඳහා 2023 වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමට ද ඇතුළත් කර සියලු කටයුතු සූදානම් කර ඇති අතර මේවන විට පවතින මූල්‍ය සීමා ඉවත් කිරීමෙන් පසු අළුත්වැඩියාකර එම ඒකකයේ පුහුණු අවශ්‍යතා සඳහා යෙදවීමට කටයුතු කරමි.

<u>2.3 වෙනත් කරුණු</u>

(අ) (ආ)

මෙකී ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් සම්බන්ධව විගණන හා කළමනාකරණ කමිටුවේ ද නිර්දේශය මත කමිටුවක් පත්කර තිබූ අතර, එම කමිටු වාර්තාව 2023(ii) වන විගණන හා කළමනාකරණ කමිටුව සඳහා ඉදිරිපත් කළ අතර, ඒ සඳහා විගණන අධිකාරිගේ නිරීක්ෂණ හා කමිටුවේ නිර්දේශ මත ක්‍රියාකර 2023 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමට පෙර නිරවුල් කිරීම සඳහා කටයුතු සිදුකරමින් පවතී.

(ඇ) එකී අරමුදල් ශේෂය 2023 වර්ෂයේ මාර්තු මස වන විට උපචිත වියදම් සඳහා වූ අදාළ ගෙවීම් නිරවුල් කිරීමේ දී සම්පූර්ණ වශයෙන් උපයෝජන වී තිබේ.

(ඈ) 2015 වර්ෂයේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීම සිදුවී ඇති අතර ඊට පෙර පැවති ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ සිටි කාර්ය මණ්ඩලය එම තනතුරට පුද්ගලික වන සේ සේවයේ යොදවා ඇත.ඔවුන්ගේ තනතුරු ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා අනුමත නොවූ තනතුරු වන බැවින් නැවත බඳවා ගැනීමක් සිදුනොවන අතර, එම තනතුරු එම නිලධාරියා/සේවකයා විශ්‍රාම යෑම/සේවය අතහැර යෑම/ මිය යෑමෙන් පසු එම තනතුරු අහෝසිවනු ඇත.

(ඉ) මෙම පුරප්පාඩු වී ඇති තනතුරු ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය පුහුණු අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු වේ. එම තනතුරු සඳහා අනුමත වැටුප් කේත DMS 30 යටතේ වූ වැටුප් කේත වන බැවින් ගැටළු තත්ත්වයන් පැන නැගී ඇති අතර,ඊට විසඳුමක් ලබාදෙන ලෙස කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව

වෙත යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන ලදී. ඊට පිළිතුරු ලෙස 2014 අංක 31 දරණ විශ්වවිද්‍යාල පනතේ 5 (ඌ) වගන්තිය යටතේ ජාතික ධිවර හා සමුද්‍රීය පුහුණු ආයතනය පිහිටුවීමේ අවශ්‍යතාවය පෙන්වා දී ඇත.ඊට අදාළ මූලික කටයුත්ත සිදුකරමින් පවති.එම ගැටළු නිරාකරණය වනතෙක් පුහුණු පාඨමාලා පවත්වාගෙන යෑම සඳහා කොන්ත්‍රාත්/බාහිර උපදේශක පදනම් මත අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගෙන පාඨමාලා ගුණාත්මක හා ඵලදායිලෙස පවත්වාගැනීමට කටයුතු කරන ලදී.

පාඨමාලා සම්බන්ධීකරණය,ස්ථිර කාර්ය මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක,/විද්‍යාල උපදේශක වරුන් මගින් සිදුකරනු ලබයි.

(ඊ) රාජ්‍ය ආයතනවල සේවක සංඛ්‍යාව හා බඳවා ගැනීම් පිළිබඳව නියාමන ආයතනය වූ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සාගර විශ්වවිද්‍යාලය සඳහා අනුමත කර ඇති තනතුරු හා ඊට අදාළ වැටුප් පරිමාණයන් මත කටයුතු කර ඇත.

මහාචාර්ය වසන්ත රත්නායක
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

පිටපත -
1. ප්‍රධාන අභ්‍යන්තර විගණක.
අධ්‍යාපන අමාත්‍යාංශය.
නිපුණතා සංවර්ධන,වෘත්තීය අධ්‍යාපන අංශය.



අධ්‍යාපන අමාත්‍යාංශය,
නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන අංශය

கல்வி அமைச்சு
திறன் அபிவிருத்தி மற்றும் தொழில்சார் கல்வி பிரிவு

Ministry of Education,
Skills Development & Vocational Education Division